# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**මෙත් සවිය සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව METHSAVIYA NEWSLETTER**

❋ මෙත් සවිය දහ අට වන කාණ්ඩය ❋ තිස් හත කලාපය ❋ 2021 අප්‍රේල්




"මෙත් සවිය සඟරාව" අංක QD/පුවත්/145/2021 යටතේ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත.

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය හා ලිපි එවිය යුතු ලිපිනය :
අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්මගවේෂී බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී ලංකාරාමය, නො.55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දු: ක: 0714014467, 0112505088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපැල : office@methsaviya.org






## 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම

**දැක්ම :** බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වූ ඓතිහාසික මහියංගන රාජමහා විහාර භූමියෙහි අසූහාර දහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ පිළිමය පමණක් අඩි 84ක උසින් සහ පාදම සමග සම්පූර්ණ උස අඩි 100කින් යුක්ත ව අහසින් වඩින ඉරියව්වෙන් යුත් ලක්දිව උස ම හිටි පිළිමවහන්සේ වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමාවහන්සේ ඉදිකිරීම.

**අරමුණ :** අප තථාගත ගෞතම බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් නම මසක් ඇවෑමෙන් වූ දුරුතු පුර පසළොස්වක පොහෝ දින ශ්‍රී ලංකාද්වීපයේ මහියංගනයේ මහවැලි නදිය අසබඩ මහානාගවන නම් වූ උද්‍යානයෙහි පැවැත්වෙන මහායක්ෂ සංගමය දිවැසින් දැක පළමුවර ශ්‍රී ලංකාවට වැඩම කොට, ඉහළ අහසේ පෙනී සිට, නොයෙකුත් ප්‍රාතිහාර්ය දක්වා යක් පිරිස් දමනය කර, ඔවුන් ගිරි දිවයිනට යවා, මෙම දිවයින ධර්මයෙහි පැවැත්වීමට සුදුසු ස්ථානයක් බවට පත්කළ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර වන ලද්දා වූ ද, බුදුරජාණන් වහන්සේ ජීවමාන ලෙස වැඩසිටි කාලයේ දී ම තනන ලද්දා වූ ප්‍රථම චෛත්‍ය රාජයාණන් වහන්සේ ලෙස මහාවංශය ඇතුළු මූලාශ්‍රයන් හි සඳහන් වන ඓතිහාසික මහියංගන රාජමහා විහාරයට අයත් පුදබිමෙහි මෙතෙක් උස බුදුපිළිමයක් ගොඩනගා නැතිබැවින් එම අඩුව සපුරා බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සමරණු පිණිස ද, ඒ වෙනුවෙන්, බුද්ධශාසනය අවසානය වන තෙක් පවතින රට ලෙස සැලකෙන ශ්‍රී ලංකාද්වීපයෙහි චිරාත්කාලයක් පවත්නා පූජා වස්තුවක් ලෙස අසූහාරදහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට අධාරකයක් නොමැති ලක් දිව උස ම හිටි පිළිමය වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ගොඩනගා බුදුන් වැඩි ස්ථානයෙහි බුද්ධාලම්බන ප්‍රීතිය වැඩිවන අයුරින් බැතිමතුන් හට වන්දනා මාන කර කුසල් රැස්කරගැනීමට අවස්ථාව සැලසීම සහ බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය පිණිස උපයෝගී වීම.

## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා වන සියළුම ආධාර **"සම්පත් බැංකුවේ ( 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා අරමුදල )** නමින් ඇති **"000560001118"** ගිණුමට බැර කරන්න.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය


මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය

දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපැල : office@methsaviya.org

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07


## මෙත් සවිය 2020 / 2021 වසර සඳහා විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරාධිපති,
අතිපූජ්‍ය වීරගොඩ ඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී

මහාචාර්ය චන්දන ජයරත්න මහතා.
දු:ක : 0714800800, ෆැක්ස් : 0112 515 615
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

කෝසල එදිරිසිංග මහතා — දු.ක : 0716 322 306
චින්තක බණ්ඩාර මහතා — දු.ක : 0718 114 477

**ගරු සම ලේකම්වරු**

මංජුල පත්මකුමාර මහතා. — දු.ක : 071 529 5855
පියල් චන්ද්‍රතුංග මහතා — දු.ක : 071 450 1358

**ගරු භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා — දු.ක : 0775 994 987

**ගරු උප භාණ්ඩාගාරික**

චේනුක ජයනාත් මහතා — දු.ක : 0714 333 868

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. — දු.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මෙනුර ඩයස් මහතා 0713370782 / ජගත් ප්‍රසන්න මහතා 0715836653
චමින්ද ඉන්දික මහතා 0712299212 / මාලන් කන්දගේ මහතා
0725361040 / නුවන් පෙරේරා මහතා 0777005772 / දයානන්ද
ඉලේපෙරුම මහතා 0777898956

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

සමීර දයානන්ද මහතා — දු.ක : 0772 347 157

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී.පී. පෙරේරා මහතා — දු.ක : 0719 441 269

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය — දු.ක : 0777 613 659

**තරුණ කමිටුව - සභාපති**

ලහිරු චන්දික ද සිල්වා මහතා — දු.ක : 0702 089 956

**අසරණ සරණ කමිටුව - සභාපති**

අමල් බණ්ඩාර මහතා — දු.ක : 070 1779 877

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා — දු.ක : 0714 078 429

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

යසින්ත රෂාන් මහතා — දු.ක : 0714 501 358

**අධීක්ෂණ කමිටුව**

ජ්. ජ්. තිලකසිරි මහතා / වික්‍රම ගුණදාස මහතා

**සුභසාධක කමිටුව**

සුනිල් හේවාවසම් මහතා — දු.ක : 0714 963 583

**පර්යේෂණ කමිටුව - සභාපති**

චින්තක බණ්ඩාර මහතා — දු.ක : 0718 114 477

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර පහළොවකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි**. වර්තමාන සාමාජික සංඛ්‍යාව 6,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් දහ හත් වසරක් සහ බොරැල්ල ශ්‍රී ලංකාරාම මූලස්ථානය කරගනිමින් වසරක පමණ කාලයක් **"මෙත් සවිය මෛත්‍රී සංසදය"** පසුගිය දහසය වසරක් පුරා සමථ විපස්සනා භාවනාව හය දහස් පන්සියයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය 18 වසරක් පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 44 වන භාවනා වැඩසටහනේ ඉතිරි කොටස 2021 අප්‍රේල් මස 25 වන ඉරුදින සිට නැවත ආරම්භ වේ.

## 2021 අප්‍රේල් 18-19 මෙත් මෙත් සවිය මගින් නොමිලයේ උගන්වන "මෙත් සවිය ළදරු පාසල" ආරම්භය (මෙදිනට ශිෂ්‍යත්ව සහ පාසල් උපකරණ පරිත්‍යාග කල හැක.)

මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන අභිනවයෙන් ඉදිකල ගොඩනැගිලි, වැසිකිළි, ක්‍රීඩා උයන සහිත මෙත් සවිය කළුතර පෙර පාසැල අප්‍රේල් 18 වන ඉරුදින පෙ.ව. 10.00 උත්සවාකාරයෙන් ඇරඹේ. (පැමිණෙන්නේ නම් කල් තියා දැනුම්දෙන්න). එය පිහිටා ඇත්තේ කළුතර හොරණ පාරේ පරදූව තෝරගල්ල සිරි සදහම් අරණ විහාර භූමියේ ය. පූජ්‍ය සුගතානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන් හා මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණයෙන් පැවැත්වේ.

නිතර ගංවතුරට යටවන මෙම පෙදෙස්වල ඉතා දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් වල ළමුන් සඳහා ඉංග්‍රීසි හා සිංහල භාෂා මාධ්‍ය දෙකෙන් ම පෙර පාසැල් අධ්‍යාපනය ලබාදීමට කටයුතු සංවිධානය කර ඇත. ළමුන් 40 ක් දක්වා ඉගැන්වීමේ පහසුකම ඇති මෙම පෙර පාසැලේ අධ්‍යාපන කටයුතු සියල්ල නොමිලයේ සැපයේ.

නොමිලයේ සපයනු ලබන ඇඳුම් කට්ටල, සපත්තු, පාසල් උපකරණ, ක්‍රීඩා භාණ්ඩ මෙන්ම විදුලි බිල්පත් - ජල බිල්පත් හා පෙර පාසැල් ගුරුතුමිය හා පාලිකාවගේ ගෙවීම් යනාදිය සඳහා සෑම මසකම බරපැන රු.25,000/- ඉක්මවයි.

අධ්‍යාපනය ලබා දීම සඳහා සෑම මසකම ඉහත මුළු මුදල ම හෝ එක් ළමයකු සඳහා රු.1,500/-ක ශිෂ්‍යත්වයක් ලබා දී ප්‍රඥාකාරක කුසල් ලබනු කැමති පිංවතුන් වෙතොත් උප සභාපති චින්තක බණ්ඩාර මහතා - (0718 114 477) කාර්යාලයේ දී හමු වී හෝ කළුතර ශාඛාවේ සභාපති - හිටපු පොලිස් පරීක්ෂක නිහාල් මෙන්ඩිස් මහතා (071 826 6143) හෝ අමතන්න. පෙර පාසල 2021 අප්‍රේල් මස 19 වන දින සිට සතියේ දිනවල නොකඩවා පැවැත්වේ.

## 2021 මැයි 02 වන ඉරු දින, මෙත් සවිය වාර්ෂික මහ සභා රැස්වීම සහ ධර්ම දේශනාව

අප්‍රේල් මස පැවැත්වීමට නියමිතව තිබී ''කොවිඩ් ව්‍යසන'' තත්වය මත කල් දමන ලද මෙත් සවිය 18 වන මහා සමුළුව 2021/05/02 වන ඉරු දින දී පැවැත්වේ. 2020 අයවැය ඉදිරිපත් කිරීම හා 2021 සඳහා නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08 හි. ධර්ම දේශනාව අවසානයේ දී පැවැත්වේ. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇති නම් 2021/04/30 දිනට පෙර කාර්යාලයට භාර දෙන්න. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියලුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට පළමුව සාමාජිකත්වය අලුත් කරගන්නා මෙන් ඉල්ලමු. ''කොවිඩ් ව්‍යසන'' තත්වය මත ඉතා සුළු පිරිසක් සහභාගී වන ලෙස සෞඛ්‍යාරක්ෂාව සහිතව පවත්වන මෙම සංවත්සරික මහා සභාව දින වෙනදාට පැවැත්වෙන මෛත්‍රී භූෂණ සම්මාන උළෙල හා පසුගිය වසරේ දී අනුපමේය සේවයක් කර ඇති සාමාජිකයින්ට පිරිනමන මෙත් සවිය විශිෂ්ඨ සේවා සම්මාන උළෙල මෙවර නොපැවැත්වේ. **(නිලතල සඳහා අයදුම් පත්‍රය සඟරාවේ ඉදිරි පිටක ඇත.)**

මහසමුළුව ආරම්භයට පෙර ප.ව. 2.00 සිට 3.00 දක්වා සාමාන්‍ය භාවනා වැඩසටහන පැවැත්වේ. ඉන් අනතුරුව ප.ව. 3.00 - 4.00 දක්වා කිරුළපන පුෂ්පාරාම වාසී පූජ්‍ය දිවිතුරේ සුනීත ස්වාමීන්ද්‍රයන්වහන්සේගේ සුමධුර ධර්ම දේශනයක් පැවැත්වේ.

**ධර්ම දේශනාවෙන් පසුව සිදු කරන 18 වන සංවත්සර සභාවේ න්‍යාය පත්‍රය.**
**2021 /05/02 - (ප.ව. 4.00 - 5.00)**

1. ආජීව අෂ්ඨමක සීලයේ පිහිටීම.
2. මෙත් සවිය තේමා ගීතය වාදනය කිරීම.
3. න්‍යාය පත්‍රය කියවීම.
4. පසුගිය වාර්ෂික මහසභා වාර්තාව ඉදිරිපත් කිරීම.
5. වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම.
6. ඉදිරි වර්ෂය සඳහා අනුශාසක මණ්ඩලය, නිලධාරී මණ්ඩලය හා විගණකවරු පත්කිරීම.
7. ස්තුති කතාව.
8. ජාතික ගීය වාදනය කිරීම.
9. සමාප්තිය සහ තේ පැන් සංග්‍රහය.

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එළ කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එළ කරනු ලබන දැන්වීම් 2021 / 07 / 30 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

**කොවිඩ් තත්වය මගහැරෙනතෙක් නැවත දැනුම් දෙන තුරු මාසයේ පළමු ඉරු දින වැඩසටහන් සිරිත් පරිදි ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ නොපවත්වා, බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී ම පැවැත්වීමට විධායක කමිටුව තීරණය කර ඇත.**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 2021 වසර සඳහා නොමිලයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය

2021 වසර මෙත් සවිය දින දර්ශනය දැනටමත් ලබා නොගත් අයහට එය අප්‍රේල් 25 සිට බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ පිහිටි මෙත් සවිය කාර්යාලයෙන් ඉරුදින වල දී ලබාගත හැකිය.

## මෙත් සවිය සඳහම් අරණ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ මහණ කිරීම සඳහා වයස 12 - 14 අතර පිරිමි ළමුන් අවශ්‍යකර තිබේ.



බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය වෙනුවෙන් ම සාසන චිරස්ථිතිය උදෙසා ඇපකැප වීම මෙත් සවියේ දැක්ම වේ. මහියංගනය ලක්දිව උසම වටකුරු පිළිමය නෙළීම හා සසර දුකින් එතෙර කරවීමට භාවනා වැඩසටහන් පැවැත්වීමට අමතරව බොහෝ සත්කාරයන් සඳහා මෙත් සවිය පසුගිය කොවිඩ් කාලය තුල යොමු වී ඇත.

ඉතා දුෂ්කර පලාත් වලින් පිරිමි ළමුන් රැගෙනවිත් මහණ කරවා වසර 4-5 කාලයක් හොරණ විද්‍යාරතන පිරිවෙනෙන් දහම් උගන්වා වැසුනු පන්සල් වලට හා සංඝරත්නය හිඟ දුෂ්කර පලාත් වල පන්සල් වලට යොමු කිරීමේ ව්‍යාපෘතියක් කළුතර පරාදුව තෝරගල්ල සිරි සඳහම් අරණ විහාරස්ථාන භූමියේ මෙත් සවිය මගින් ඉදිකරමින් පවතී. පිරිවෙනක් දක්වා මෙම ස්ථානය වැඩි දියුණු කිරීම අපගේ අරමුණයි.

දැනට රුපියල් ලක්ෂ 25ක් පමණ මෙත් සවිය සංවිධානයේ සාමාජිකයින්ගේ ධන පරිත්‍යාගයෙන් (කුටියක් රුපියල් ලක්ෂයකි) භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදි වෙමින් පවතී.

සියම් නිකායේ පූජ්‍ය සුගතානන්ද ස්වාමින්වහන්සේ යටතේ පැවිදි කිරීම සිදු කරනු ඇත. වෙසක් හෝ පොසොනේ පොහොය අලෙලා මුල් අදියර ලෙස 15 නමක් පැවිදි කිරීමට බලාපොරොත්තු වන බැවින්, මහණ කිරීමට සුදුසු වයස 12 - 14 ත් කාණ්ඩයේ පිරිමි දරුවන් වේ නම් මෙත් සවිය සභාපති තුමා අමතා (0714 800 800) හෝ කාර්යාලය (071 401 4467) අමතා දැනුම් දෙන්න.

මෙහි ගොඩනැගිලි තැනීම ඇතුළු මූලික කටයුතු අසරණ සරණ කිමිටුව විසින් මූලිකත්වය සිදු කෙරේ.

**වසර 18 ක් තුල 6500 කට අධික සාමාජිකත්වයකට භාවනා පුහුණුකල මෙත්සවියේ**

## 45 වන ත්‍රෛමාසික චිත්ත සංයමය අභ්‍යාස හා භාවනා වැඩසටහනට

**2021 ජූලි 11 දින පියතබන වගයි.**

මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**මඟින් පවත්වනු ලබන මෙම වැඩසටහන තුලින් සම්ප්‍රදායානුකූල බෞද්ධ භාවනා ක්‍රම සහ ලොව පවතින විවිධ භාවනා ක්‍රම කිහිපයක් හඳුන්වාදෙනු ලැබේ.**

**අන් භාවනා ක්‍රම වලට වඩා බෞද්ධ භාවනා වල ඇති හරය මෙතුලින් ඔබට පසක් වනු ඇත.**

**මෙම වැඩසටහන ක්‍රමවත්ව සකසා මෙහෙයවනු ලබන්නේ ප්‍රවීන භාවනා කම්මට්ඨානාචාර්ය විශ්ව විද්‍යාල ඇදුරුතුමෙකු විසිනි.**

මෙහිදී - සමථ භාවනා ක්‍රම, බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, දස කසිනය, පිළිකුල් භාවනාව, මරණානුස්සතිය, දස අශුභය, විදර්ශනා භාවනාව, සක්මන් භාවනාව, බුරුම සහ සියම් භාවනා ක්‍රම, ටිබෙට් හා යෝග භාවනා ක්‍රම හැඳින්වීම, බටහිර මනෝ විද්‍යාවේ සංයම අභ්‍යාස (Relaxation Techniques) හා NLP ක්‍රම හැඳින්වීම, සිතෙහි ඇල්ෆා අවස්ථාව භාවිතයෙන් ලෞකික ජීවිතයේදී සාර්ථකවන ක්‍රම, භාවනාව තුලින් රෝග නිවාරණය වන අන්දම, සතුරන්ට මුහුණ දෙන ක්‍රම, අධ්‍යාපනය සඳහා ධාරණ ශක්තිය වැඩි කරගන්න අන්දම, අනිමිතලෝචන භාවනාව, අටලෝදහම භාවනාව, දෑස් විවෘතව කරන Open eye meditation techniques, පරමෝත්කෘෂ්ඨ (TM) භාවනාවට සමාන භාවනා ක්‍රම හඳුන්වා දීම ආදිය.

**2021 ජූලි 11 ආරම්භ වන 45 වන වැඩසටහනට සහභාගී වීමට පහත වෙබ් අඩවියෙන් හෝ දුරකථනයෙන් අමතා අයදුම් පතක් ලබාගෙන සම්පූර්ණකර පහත ලිපිනයට තැපැල් කරන්න.**

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.
දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08
සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂී බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

# මෙත් සවිය

**මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ**

# 17 වන සංවත්සර මහ සභා වාර්තාව

මෙත්සවිය 17 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව ශ්‍රී ලංකාරාමය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල යන ස්ථානයේදී 2020 අගෝස්තු 02 දින පවත්වන්නට යෙදිනි. මෙත්සවිය සංවත්සරය නිමිතිකොට ගෙන, මෙත්සවිය පැවිදි අනුශාසකව වැඩසිට අවත්වී වදාළ ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ප්‍රධාන අධිකරණ සංඝනායකව වැඩසිටි අතිපූජ්‍ය අහංගම ආනන්ද නායක ස්වාමීන්වහන්සේ ඇතුළු සියළු  මියගිය මෙත්සවිය සමාජිකයන්ට පිං අනුමෝදම් කිරීමේ සහ සියළු මෙත්සවිය සාමාජිකයන්ට සෙත් පැතීමේ අරමුණින් සංඝගත දක්ෂිණාවක් එදින උදෑසන සිදු කරන ලදී. දානමය පිංකමින් අනතුරුව සවස දෙකට කැස්බෑව සාශනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ගොම්බද්දර ධම්ත ස්වාමීන්වහන්සේ විසින් රැස්ව සිටි මෙත්සවිය සාමාජිකයන් වෙත වටිනා ධර්ම දේශනයක් පවත්වන ලදී. ධර්ම දේශනයෙන් අනතුරුව මෙත්සවිය මහසමුළුවේ කටයුතු මුලසුන හෙබවූ පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමීන්වහන්සේගේ ප්‍රධානත්වයෙන්, මෙත්සවිය නිර්මාර්තෘ සහ මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා ප්‍රධාන මෙත්සවිය විධායක කමිටුවේ නිලධාරී මණ්ඩලයේ සහ අනුකමිටු සභාපතිවරුන් ප්‍රමුඛ අනුකමිටු නිලධාරීන් සහ මෙත්සවිය සාමාජිකයන් සහභාගිත්වයෙන් සවස 3.30 ට ආරම්භ කරන ලදී.

සංවත්සර සභාව ආජිවක අෂ්ඨමක සීලයේ පිහිටුවීම පිණිස මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමීන්වහන්සේහට ආරාධනා කරන ලදී. සභාව ආජීවක අෂ්ඨමක සීලයේ පිහිටවීමෙන් අනතුරුව මෙත් සවිය තේමා ගීතය ගායනා කරමින් සංවත්සර සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී. මෙත්සවිය සමලේකම් මංජුල පත්මකුමාර මහතා විසින් න්‍යායපත්‍රය සභාවට ඉදිරිපත් කරන ලදී. ඉන්පසුව මංජුල පත්මකුමාර මහතා විසින් පසුගිය වාර්ෂික සභා වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට කෝසල එදිරිසිංහ මහතා යෝජනා කල අතර චේනුක ජයනාත් මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. අනතුරුව 2019 - 2020 වර්ෂයන් සඳහා වූ මෙත් සවිය ක්‍රියාකාරකම් වාර්තාව මංජුල පත්මකුමාර මහතා විසින් සභාවට ඉදිරපත් කරන ලදී. ඉන්පසුව මෙත්සවිය උප භාණ්ඩාගාරික චේනුක ජයනාත් මහතා විසින් වාර්ෂික අයවැය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මංජුල පත්මකුමාර මහතා යෝජනා කිරීමෙන් අනතරුව එම යෝජනාව පියල් චන්ද්‍රතුංග මහතා ස්ථිර කරන ලදී. ඊළගට න්‍යායපත්‍රානුකූලව නව නිලධාරී මණ්ඩලය පත්කිරීම එලඹිනි. මෙත්සවිය ව්‍යවස්ථාවට අනුකූලව මෙත්සවිය සියළු නිලධාරීන් තම තනතුරුවලින් ඉල්ලා අස්වෙන ලදී. මෙත්සවිය ගරු පැවදි අනුශාසක පදවිය සඳහා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටක විශාරද අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහනායක ස්ථවිරයන් වහන්සේගේ සහ බොරැල්ල ලංකාරාමාධිපති, පූජ්‍ය වීරගොඩ ඥාණ ස්ථවිරයන් වහන්සේගේ නම් යෝජනාවූ අතර සභාවේ සියළුදෙනා සාධුකාරදී එම යෝජනාවන් ස්ථිර කරන ලදී. නව නිලධාරී මණ්ඩලය පත්කිරීම සඳහා මෙත්සවිය වෙත ලැබී ඇති අයදුම් පත් අනුව නිලධාරීන් මණ්ඩලය වෙනුවෙන් යෝජිත නම් මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙත්සවිය ගරු සභාපතිතුමන් ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ නමද, උප සභාපති තනතුරු සඳහා චින්තක බණ්ඩාර සහ කෝසල එදිරිසිංහ යන මහත්වරුන්ගේ නම්ද, සම ලේකම් තනතුරු සඳහා පියල් චන්ද්‍රතුංග සහ මංජුල පද්මකුමාර යන මහත්වරුන්ගේ නම්ද, භාණ්ඩාගාරික තනතුර සඳහා සුරංග ලියනගේ මහතාද, උප භාණ්ඩාගාරික තනතුර සඳහා චේනුක ජයනාත් මහතාද, සංස්කාරක තනතුර සඳහා එම්. කේ. ප්‍රියන්ත මහතාද, කාරක සභික වරුන් ලෙස මාලන් කන්දගේ, මෙනුර ඩයස්, නුවන් පෙරේරා, දයානන්ද ඉලේපෙරුම, චමින්ද ඉන්දික, ජගත් ප්‍රසන්න යන මහත්වරුන්ද තෝරා පත් කරගැනීමට යෝජනා විය. තවද වෙබ් හා මාධ්‍ය කමිටුවේ සභාපතිත්වය සඳහා සමීර දයාන් මහතාද, දාන - සීල - භාවනා කමිටුවේ සභාපතිත්වය සඳහා යසින්ත රෂාන් මහතා ද, පර්යේෂණ කමිටුවේ සභාපතිත්වය සඳහා චින්තක බණ්ඩාර මහතා ද, සුභසාධන කමිටුවේ සභාපතිත්වය සඳහා සුනිල් හේවාවසම්  මහතා ද, අසරණ සරණ කමිටුවේ සභාපතිත්වය සඳහා අමල් බණ්ඩාර මහතා ද යන ලෙස නම් යෝජනා කරන ලදී. එම සියළු නිලධාරී පත්කිරීම් සභා සම්මත කිරීම සඳහා ප්‍රේමදාස පෙරේරා මහතා යෝජනා කල අතර වික්‍රම ගුණදාස මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. 2020 - 2021 මීලඟ වර්ෂය සඳහා විගණක වරුන් ලෙස MKJ Associate ආයතනය තෝරාපත් කරගැනීමට මංජුල රණසිංහ මහතා යෝජනා කල අතර එම යෝජනාව පී. පී. තිලකසිරි මහතා ස්ථිර කරන ලදී. 2020 - 2021 මීලඟ වර්ෂය සඳහා සමාගම් ලේකම් තනතුර සඳහා රොබට් හේවගේ මහතා තෝරාපත් කරගැනීමට මංජුල පත්මකුමාර මහතා යෝජනා කල අතර එම යෝජනාව පී. පී. තිලකසිරි මහතා ස්ථිර කරන ලදී.

න්‍යායපත්‍රයට අනුව මීලගට ස්තුති කතාව යෙදී තිබු අතර මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් මෙත්සවිය 17 වන වාර්ෂික මහා සමුළුව සඳහා විවිධ ආකාරවලින් සහයෝගය දැක්වූ පිරිසට සහ ආයතන වලට සංසදයේ කෘතඥ පූර්වක ස්තුති ප්‍රකාශ කරන ලදී.

# මෙතෙක් අප ආ ගමන් මගෙහි

## නොමැකෙන පිය සටහන් වලින් බිඳක්... 2020/21 වසරේ ප්‍රගතිය

- 2020 මැයි මස 26 දින මෙත්සවිය සංසදය මගින් සම්බන්ධීකරණය කර, මෙත්සවිය අධීක්ෂණ කමිටු සාමාජික වික්‍රම ගුණදාස මහතාගේ දායකත්වයෙන් අසරණවූ අයකුට රෝද පුටුවක් පරිත්‍යාග කිරීම. මෙම කටයුත්තට අදාල ප්‍රවාහන වියදම් හේමන්ති පෙරේරා මහත්මිය දරණ ලදී.
- කොවිඩ් 19 උවදුර පිටුදැකීමට උපකාර කිරීමට ජංගම දුරකථන යෙදවුමක් ජාතික පර්යේෂණ සභාව මගින් ගොඩනැගිම සිදුකල අතර මෙත්සවිය පර්යේෂණ කමිටුව සහ මෙත්සවිය වෙබ් හා මාධ්‍ය කමිටුව මගින් මෙම ජංගම දුරකථන යෙදවුම ගොඩනැගීමට ඉමහත් දායකත්වයක් ලබාදෙන ලදී. මිතුරු මිතුරෝ වෙනුවෙන් මත්ද්‍රව්‍ය භාවිත නිවාරණය සඳහා උදව් දෙන නව ජංගම දුරකථන යෙදවුමක් ද නිර්මාණය කෙරෙමින් පවතී.
- 2020 ජුනි මස, මෙත්සවිය අසරණ සරණ කමිටුවේ ප්‍රධානත්වයෙන් මරණයට නියම වී සිටි ගවයන් 9 දෙනෙකු නිදහස් කර වව්නියාවෙන් ඔබ්බෙහි මායිම් ගමක් ව පැවති හොරොව්පතාන ගම්මානයේ ජීවත්වන ආර්ථික දුෂ්කරතා ඇති පවුල් වෙත ලබා දෙන ලදී. අද ඔවුහු කිරි විකුණා ජීවිකාව රැකගනිති.
- 2020 අගෝස්තු 02 දින මෙත්සවිය 17 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී පවත්වන ලදී. වාර්ෂික මහා සමුළුවට සමගාමීව මියගිය මෙත්සවිය සමාජිකයන්ට පිං අනුමෝදම් කිරීමේ සහ සියළු මෙත්සවිය සාමාජිකයන්ට සෙත් පැතීමේ අරමුණින් සංඝගත දක්ෂිණාවක් මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් සහ මෙත්සවිය සාමාජිකයන්ගේ මුල්‍යමය පරිත්‍යාගයෙන් සිදුකරන ලදී. එදින සවස කැස්බෑව ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරී ගොම්බද්දර ධම්ත ස්වාමින්වහන්සේ විසින් රැස්වසිටි මෙත්සවිය සාමාජිකයන් වෙත වටිනා ධර්ම දේශනයක් පවත්වන ලදී.
- 2020 නොවැම්බර් 15න් පසු කොවිඩ් දෙවන රැල්ල මත නැවත 2021 අප්‍රේල් 25 අරඹන තෙක් භාවනා වැඩසටහන් තාවකාලිකව නවතා දමන්නට සිදු විය. මෙම කාලය තුල විධායක කමිටවු සෑම සතියක ම ඉරු දින සවස 5.30 ට ZOOM හරහා රැස්වීම් පවත්වා ඇත.
- 2020 සැප්තැම්බර් 01 දින මෙත්සවිය සාමාජිකයන් පිරිසක් මහියංගනය බුදුපිළිමවහන්සේ ඉදිකෙරෙන භූමියේ නිරීක්ෂණ චාරිකාවක් සිදුකර, එදිනම ශ්‍රමදානයක් සංවිධානය කර පිළිමවහන්සේ ඉදිකරන සීමාමාලකය අවට ප්‍රදේශය එළිපෙහෙළි කර පිරිසිදු කරන ලදී.
- තම නිවසේ වහලය පිළිසකර කරගැනීමට අපහසුව සිටි මෙත්සවිය සාමාජිකාවගේ නිවසේ වහලය මෙත්සවිය අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් 2020 සැප්තැම්බර් 08 වන දින පිළිසකර කර දෙන ලදී.
- 2020 සැප්තැම්බර් 13 දින අසරණව සිටි රෝදපුටුවක් අවශ්‍ය මවකට රෝදපුටුවක් පරිත්‍යාග කිරීම අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.
- කොවිඩ් උවදුර මත ඇතිවී තිබූ අපහසුතාවයන් මගහරවා ගැනීම පිණිස මෙත්සවිය කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවාසය වෙත වියලි අහාර පරිත්‍යාගයක් 2020 දෙසැම්බර් මස සිදු කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ජන්මදිනය නිමිතිකොට ගෙන මෙත්සවිය කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවාසය අළුතින් වර්ණ ගන්වා පිළිසකර කරන ලදී.
- 2020 සැප්තැම්බර් 13 දින මෙත් සවිය සනීපාරක්‍ෂක කටයුතු සඳහා දායක වන රීටා ආච්චිට නිවසක් තනා දී පරිත්‍යාග කිරීම අසරණ සරණ කිමිටුවේ අනුග්‍රහයෙන් සිදු කරන ලදී.
- 2020 සැප්තැම්බර් 19 දින මෙත්සවිය සියලුම කමිටු දායකත්වයෙන් සහ අසරණ අරණ කමිටුවේ සංවිධාන ශක්තියෙන් මරණයට නියම කරන ලද කිරි ගවයන් 8 දෙනුකු නිදහස් කර දුෂ්කර ප්‍රදේශවල අඩු අදායම් ලබන පවුල් 6 ක් සඳහා පරිත්‍යාග කරන ලදී.
- මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ජන්මදිනය වෙනුවෙන් 2020 සැප්තැම්බර් 20 දින මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධානයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවසේ නේවාසිකව සිටින වැඩිහිටි මව් - පියවරු වෙත ඔවුනට අවශ්‍ය රෙදිපිළි පරිත්‍යාග කරන ලදී. එම කටයුත්ත සඳහා මුල්‍ය දායකත්වය කාන්තා කමිටුවේ උපසභාපතිනිය වන හේමන්ති පෙරේරා මහත්මිය ලබාදෙන ලදී.
- කොවිඩ් කාලය තුල අසරණ භාවයට පත් වූ මෙත් සවිය සාමාජිකයන්ගේ ඉල්ලීම පරිදි මහචාර්ය චන්දන ජයරත්න මහතා විසින් රුපියල් ලක්‍ෂයකට අධික මුදලක් අපසු නොගන්නා ආධාර ලෙස සිය ධන පරිත්‍යාගයෙන් ලබාදීම සිදුවිය.
- සෑම වර්ෂයකම සිදුකරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් 2021 ජනවාරි 01 වන දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදි ස්වාමින්වහන්සේලා 37 නමක් උදෙසා මෙත් සවිය සාමාජිකයින් ඉතා සුළු පිරිසකගේ (50 දෙනෙකු පමණ) සහභාගීත්වයෙන් (කොවිඩ් 19 තත්වය මත පනවා තිබු සීමා නිසා) සිදු කරන ලදී.
- මෙත්සවිය සංසදය මගින් සෑම වර්ෂයකම ජනවාරි 01 දින කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ කුඩා දරුවන් උදෙසා දහවල් දානමය පිංකමක් සිදුකලද කොවිඩ් උවදුර නිසා එම පිංකම සඳහා මුල්‍යමය දායකත්වය පමණක් ලබාදී එම පිංකම 2021 ජනවාරි 01 සිදු කරන ලද අතර මුල්‍යමය දායකත්වය මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා දරණ ලදී.
- 2020 නොවැම්බර් 22 වන ඉරු දින මෙත්සවිය කළුතර ශාඛාව කළුතර පරදුව තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ ස්ථාපනය කරන ලදී. එම ස්ථානයේ සසුන්ගත වී පිරිවෙන් අධ්‍යාපනය සිදුකල හැකි පරිදි භික්ෂූන්වහන්සේ 15 නමක් උදෙසා අවශ්‍ය කුටි ඇතුළු සියළු යටිතල පහසුකම් ගොඩනැගීම ආරම්භ කර ඇති අතර මේ වනවිට එම ව්‍යාපෘතියේ අවසන් අදියරට පැමිණ ඇත. ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සහ නියාමනය අසරණ සරණ කමිටුවේ සහ විධායක කමිටුවේ දායකත්වයෙන් සිදු කරන ලදී.
- මෙත්සවිය කළුතර ශාඛාවට අනුබද්ධව පරදුව තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ මෙත්සවිය සංසදය මගින් ආර්ථික අපහසුතා ඇති පවුල්වල දරුවන් උදෙසා පෙරපාසලක් ආරම්භකිරීමට සියළු වැඩකටයුතු සංවිධානය කර ඇති අතර කොවිඩ් තත්වය මත ඇතිවී තිබෙන සීමාවන් ලිහිල්වූ නිසා පෙර පාසැල 2021 අප්‍රේල් 18 දින ආරම්භ කරනු ඇත.
- 2021 පෙබරිවාරි 24 වන දින බොරැල්ලේ ලංකාරාමයේ විහාරාධිපති වීරගොඩ ඥාණ ස්වාමීන්වහන්සේ වෙත රුපියල් ලක්‍ෂ 04 ක පමණ වියදමින්, වායු සමීකරණ සහිත කුටියක් තනා පූජා කරන ලදී.



# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2020. 03. 31 සිට 2021. 03. 31 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

## (ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)

**මෙම විස්තර www.methsaviya.org වෙබ් අඩවියෙහි ද ඇතුලත් වන අතර බුදු පිළිම වහන්සේ නෙළීම එහි ස්ථාපිත කැමරා මගින් සජීවීව නැරඹීමට ඔබගේ ජංගම දුරකථනයෙන් පහත App ඇප් එක බාගතකර ස්ථාපනය කරගන්න.**

**App Name - HikConnect / User name - 940772257287 / Password - Meth@123**

| ටිකට් පත් අංකය | නම | සාමාඃඅංක | මුදල රු |
|---|---|---|---|
| 14/A-47526-47550 | එස්. පි. පිරිස් | 41-6270 | 5,000 |
| 14 E-215 | කේ. ආර්. ගුණවර්ධන මයා | | 5,000 |
| 14 H-17 | ශ්‍යාමා සමරදීර මිය | 08-1472 | 50,000 |
| 14 G-138 | හර්ෂ සොයිසා මයා සහ<br>ලලනි සොයිසා මිය | 41-6234 | 100,000 |
| 14 H-16 | එස්. සි. සමරනායක මිය | 43-6605 | 50,000 |
| 440 | මිහිර ජයරත්න මයා | | 3,100 |
| 439 | ලලන්ගා ගුණරත්න මිය | | 2,000 |
| 16/ J-041 | ලාල් රූපසිංහ මයා | ..-611 | 101,000 |
| 16/ J-042 | හිටපු ඌව පළාත්සභා අමාත්‍ය<br>රවීන්ද්‍ර අනුර විදානගමගේ මයා | | 1,000,000 |
| 14/F-125 | ජේ. ඒ. ධම්මික මයා | 27-4161 | 10,000 |
| 14/F-216 | මිහිරි පෙරේරා මිය සහ<br>පි. ජී. ඩී. ගුණවර්ධන | 37-5720<br>37-5721 | 5,000 |
| 59250 | බී. වයි. එස්. කේ. චන්ද්‍රසේන මයා | | 100 |
| 14/C-1348 | සෝමා දීගල්ල මිය | 27-4211 | 500 |
| 14/C-1133 | නිලාන් රණසිංහ මයා | මහියංගන<br>විහාරයේදී | 500 |
| 1132 | ආර්. ඩී. ලීලාවතී මිය | මහියංගන<br>විහාරයේදී | 680 |
| 14 D-1034 | කේ. එම් .පෙරේරා මිය | | 1,000 |
| 15 D-1035 | ජේ. එච්. එම්. කුලතුංග | 11-2014 | 1,000 |
| 15 D-753 | එච්. එම්. සෙනවිරත්න | මහියංගන<br>විහාරයේදී | 1,000 |
| 17 D-756 | කරුණාරත්න බණ්ඩා මයා | මහියංගන<br>විහාරයේදී | 1,000 |
| 19 D-759 | ආර්. ඩී. ලීලාවතී මිය | මහියංගන<br>විහාරයේදී | 1,000 |
| 20 D-760 | නිමල් මහින්ද්‍රපාල මයා | මහියංගන<br>විහාරයේදී | 1,000 |
| 14 D-751-752 | කුමාරි මොරෙමද මිය | මහියංගන<br>විහාරයේදී | 2,000 |
| 16 D-754-755 | ගරු සුනන්ධා සිල්මාතාව | මහියංගන<br>රාජ මහා<br>විහාරයේදී | 2,000 |
| 18 D-757-758 | ගරු කේ. සුබද්‍ර සිල්මාතාව | මහියංගන<br>විහාරයේදී | 2,000 |
| 14/A-57901-57925 | නිමල් වික්‍රමසිංහ මයා | 42-6346 | 2,500 |
| 987 | දුලාජ් ලහිරු මයා | 42-6377 | 2,500 |
| 14/A-57976-<br>58000/58576-58625 | තිලිණි දයාරත්න මිය | 43-6517 | 7,500 |
| 14/F-131 | තිලක් රණසිංහ මයා | | 10,000 |
| 14 H-23 | විනිතා රංජනී උඩුගොඩ මිය | 11-2002 | 50,000 |
| 14 G-139 | නිලන්ත විජේසිංහ මයා සහ<br>ගිම්හානි ජයරත්න මිය | | 100,000 |
| 441 | ඩබ්. ඒ. සෝමලතා රත්නසිලි මිය | | 105,000 |
| 14 D-1016 | ආර්. ඒ. ඒ. එස්. සෙනවිරත්න මිය | | 1,000 |
| 442 | චන්ද්‍රානි ඒකනායක මිය සහ<br>ඊ. ඒකනායක මයා | | 1,500 |
| 988 | කෝසල මයා | | 1,810 |
| 2471 | ශාලිකා නදීෂානි මිය | | 2,500 |
| 14/A-51176-51200 | චන්ද්‍රානි ඒකනායක මිය සහ<br>ඊ. ඒකනායක මයා | | 2,500 |
| 14/A-57775-57800 | සුනිල් හේවාවසම් මයා | 37-5669 | 2,500 |
| 14 E-240 | එම්. ඩී. කාන්ති විරසිංහ මිය | | 5,000 |
| 443 | ජී. ආර්. මාලනී හේමලතා මිය | | 7,500 |
| 14 F-126 | ප්‍රේමා චන්ද්‍රසේන මිය | | 10,000 |
| 14 F-127 | ජේ. ඩී. සිල්වා මිය | | 10,000 |
| 14 H-19 | මහාචාර්ය ටී. ආර්. ආරියරත්න මයා | | 50,000 |
| | ටී. එස්. එච්. ජයසිරි මයා සහ<br>චමින්ද කරුණාරත්න මයා | මහියංගන<br>විහාරයේදී | 50,300 |
| | මෙත්සවිය සාමාජිකයන් මහියංගන<br>රාජ මහා විහාරයේදී | | 67,000 |
| 14 H-31/32 | ප්‍රධාන පොලිස් පරීක්ෂක<br>එස්. ජී.ඒ. ආර්. එල්. සේනාදීර මයා | මහියංගන<br>විහාරයේදී | 100,000 |
| 14 G-150 | නිහාල් අබේගුණසේකර මයා සහ<br>ලතා අබේගුණසේකර මිය | | 100,000 |
| 14 G-151 | කේ. ඩී. අයි. සී. හෙට්ටිආරච්චි මිය | | 100,000 |
| 14 D-1017 | සුභද්‍ර කරුණාරත්න මිය | | 1,000 |
| 14 D-741 | රන්ජනී ජයසිංහ මිය | | 1,000 |
| 14 D-1018 | මලිත් නිරෝෂන් කුමාර මයා සහ<br>කෂ්කා චතුරංගි මිය | 36-5532 | 1,000 |
| 14 D-569 | ජේ. රාමවික්‍රම | | 1,000 |
| 14 D-570 | ටී. සමරවීර | | 1,000 |
| 14 D-567-568 | සි. ඒ. කේ. පි. තිලකවර්ධන | | 2,000 |
| 14 D-555-556 | කාන්ති මදුරසිංහ මිය | | 2,000 |
| 445 | පූජ්‍ය ලුණුගම්වෙහෙරේ සුනීත<br>ස්වාමීන් වහන්සේ | | 2,000 |
| 14/A-32401-32425 | පි. ජේ. ධර්මබන්දු මයා | 38-5894 | 2,500 |
| 14/A-57501-57525 | ජයන්ති ප්‍රනාන්දු මිය | 5-953 | 2,500 |
| 14/A-58426-58450 | තේජා පද්මිණී මිය | 5-9524 | 2,500 |
| 14 E-218 | ගාමිණී සේනාරත්න මයා | | 5,000 |
| 14/A-56701-<br>56725/58176-58225 | කේ. එම්. ඩී. බණ්ඩාර මයා | 42-6364 | 7,500 |
| 437 | හේමා පරකටවෙල්ල කුමාරතුංග මිය | | 15,000 |
| 444 | කාන්ති කොඩිතුවක්කු මිය | | 20,000 |
| 14 I-240 | පියදාස සිල්වා මයා | 15-2728 | 25,000 |
| | මෙත්සවිය සාමාජිකයන් මහියංගන<br>රාජ මහා විහාරයේදී | මහියංගන<br>විහාරයේදී | 41,510 |
| 14 G-141 | සෝමරත්න අතුකෝරල මයා සහ<br>මාලනී වන්නිආරච්චි මිය | | 100,000 |
| 14 G-152 | ඩී. ඒ. ප්‍රියානක ද සිල්වා මයා සහ<br>අමල්සිරි ද සිල්වා මයා | 31-4854<br>32-4913 | 100,000 |
| 14 G-153 | අතුල දන්තනාරයන මයා | 43-6514 | 100,000 |
| 14/A-57400-57450 | ප්‍රදීප් ප්‍රනාන්දු මයා | 43-6519 | 5,000 |
| 14 A-2613 | එම්. ඒ. වී. ජී. ඩබ්. මාතරආරච්චි | 44-6761 | 2,500 |
| 14/A-32726-32750 | එන්. වී. පතිරණ | 36-5629 | 2,500 |
| 14 I-28 | චතුර මුණසිංහ මයා සහ<br>ප්‍රියන්ති මුණසිංහ මිය | 14-2396 | 25,000 |
| | මෙත්සවිය සාමාජිකයන් මහියංගන<br>රාජ මහා විහාරයේදී | | 101,660 |
| 14/A-2609 | උත්පලි වික්‍රමසේකර මිය | 44-6692 | 2,500 |
| 14 I-28 | පි. එම්. වයි. ධර්මබන්ධු මිය | 41-6285 | 25,000 |
| 14 I-29 | මුණසිංහ | | 25,000 |
| 14 D-1019 | වයි. එච්. ඩබ්. මේරිනෝනා මිය | | 1,000 |
| 14 E-218 | රංගිකා මිය නිට්ටඹුව | | 5,000 |
| 14 G-154 | ඒ. ඒ. ඒනුක එක්නාත් මයා | | 100,000 |
| 14 G-155 | විශ්වනාත් අපොන්සු මයා | | 100,000 |
| 14 H-33 | බී.එම්. ජේ. තෙන්නකෝන් මයා | | 50,000 |

# කාන්තා කමිටුව ප්‍රගති සමාලෝචනය

මෙත්සවිය සාමාජික හා ඊට සම්බන්ධ සියළු දෙනාම පමණක් නොව මුළු මහත් ලෝකවාසීන්ට ම ගත වූ අවුරුද්දක කාල සීමාව අභියෝගාත්මක එකක් විය.එදිනෙදා ගෙදර දොර ජීවිතය පවා වෙනස් කළ මේ වසංගත උවදුර අප සැම සාමාජීය, ආගමික සමීප ක්‍රියාකාරකම් වලින් ඈත් කළේ ය.

වාසනාවකට මෙන් බුදු සිරිපා පහස ලද මේ කුඩා දිවයින ලෝකයේ වෙනත් ධනවත්, බලවත් මහා රාජ්‍යයන් අතරේ කැපී පෙනෙන ආරක්ෂිත බවක් ලබා ගත් බව සත්‍යයකි. මහාචාර්යතුමන්ගේ මග පෙන්වීම යටතේ ගත වූ එම කාල පරිච්ඡේදය තුළ වුවද මෙත්සවිය කාන්තා කමිටුවට සැළකිය යුතු කාර්යය භාරයකට දායක වීමට ලැබුණි.

සතිපතා රැස්වීම් පවා නතර කරන්නට සිදු වූ වකවානුවක අප විසින් සිදු කරන්නට සැලසුම් කර තිබූ වැඩ කටයුතු කෙසේ හෝ ඉටුකර ගරනීමට හැකිවීම භාග්‍යයකි.

මහාචාර්ය තුමන්ගේ උපන් දිනය නිමිති කොට ගෙන මෙත් සවිය අළුත් නවාතැන වූ බොරැල්ලේ ලංකාරාම විහාරස්ථාන පරිශ්‍රයේ පවත්වා ගෙන යන වැඩිහිටි නිවාසය අළුතින් පින්තාරු කර අළුත් වැඩියා කටයුතු සිදු කළේ මෙත්සවිය සාමාජික සාමාජිකාවන්ගේ මූල්‍ය අනුග්‍රහය ඇතිව කාන්තා කමිටුවේ මූලිකත්වයෙනි. එමගින් වැඩිහිටි නිවාසයට ඉතා හොඳ පිරිසිදු යහපත් පෙනුමක් ඇතිවිය. වැඩිහිටි අයට ඇඳුම් පරිත්‍යාගයක් කාන්තා කමිටු උප සභාපතිනි හේමන්ති පෙරේරා, සභාපතිනි රංජනී උඳුගොඩ හා විජේතුංග යන අය විසින් සිදුකරන්නට යෙදුණි.

කොවිඩ් වසංගත රෝග තත්වය හේතුවෙන් එම වැඩිහිටි නිවාසයට ඇති වූ අපහසුතා මග හරවා ගැනීම පිණිස වියළි ආහාර පරිත්‍යාග කිරීමට ද කාන්තා කමිටුව දායක විය.

මෙත්සවිය මගින් වසරක් පාසා සෑම ජනවාරි පළමුවන දිනයක ම සිදුකරන හීල් දානමය පිංකම මෙවරත් 2021 ජනවාරි 01 දින කොළඹ ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත් වුණි. රජයේ සෞඛ්‍යය නීති රීතිවලට එකඟ වෙමින් සීමාසහිත පිරිසකගේ සහභාගිත්වය මැද එම පින්කම ඉතාමත් සාර්ථක ව සිදුකිරීමට මෙත්සවිය සාමාජික සාමාජිකාවන් සියළු දෙනාගේ ම දායකත්වයෙන් කාන්තා කමිටුව විසින් සිදු කරන ලදී.

රටෙහි පවතින වාතාවරණය මැද වුව ද මෙත්සවියට සම්බන්ධ විධායක කමිටු රැස්වීම් නවීන සන්නිවේදන තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. කාන්තා කමිටුව නියෝජනය කරමින් අපට ද එම සාකච්ඡා වලට සහභාගි වීමට ඉඩ ලබාදීම මහත් භාග්‍යයක් කොට සලකමු. මහාචාර්යතුමාගේ උපදෙස් මත එලෙස නව සන්නිවේදන අත්දැකීමකට එක්වීමට ලැබීම කාන්තා කමිටුව සලකන්නේ වාසනාවක් ලෙසිනි.

පසුගිය කාලසීමාවෙහි මෙන්ම තවමත් අනතුර පහව නොගිය මෙම කාල පරිච්ඡේදයේ ද රජයේ වෛද්‍ය උපදෙස් වලට ගරු කරමින් අපේත් අන්‍යයන්ගේත් ආරක්ෂාව සලසමින් කටයුතු කිරීම සඳහා කාන්තා කමිටුවට දියහැකි උපරිම සහයෝගය මෙත්සවියට සම්බන්ධ සියලු ම දෙනාට ලබාදීමට කාන්තා කමිටුව සූදානමින් සිටියි.

තෙරුවන් සරණින් මෙම පීඩාකාරී තත්වය ඉක්මණින් ම දුරු වී ලෝකවාසී හැමදෙනාට ම යහපත සැලසේවා.

**රංජනී උඳුගොඩ (සභාපති කාන්තා කමිටුව)**
**හේමන්ති පෙරේරා (උප සභාපති කාන්තා කමිටුව)**
**සෝමා දිගල්ල (ලේකම් කාන්තා කමිටුව)**

# අසරණ සරණ කමිටුව

- 2020 ජුනි මාසයේ මෙත් සවිය සියලු කමිටු හා මැද කොළඹ රොටරි සමාජය හා එකව මරණයට කැපවූ කිරි ගවයන් 9 දෙනෙකු නිදහස් කර ඇත. දුෂ්කර හොරොව්පතාන නාබඩවැව ප්‍රදේශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් 6 කට කිරි විකුණා ජීවත්වීමට ලබා දීම මෙමගින් සිදු කෙරිනි.
- 2020 සැප්තැම්බර් 13, තොටලග මට්ටක්කුලිය, කැම්ප් වත්තේ පදිංචි, මෙත් සවිය සාමාජික රීටා මහත්මියගේ දිරාපත්ව තිබූ වහලය හා නිවස පිළිසකර කර දීම.
- 2020 සැප්තැම්බර් 13 දියවැඩියා රෝගය නිසා පීඩාවට පත් සැත්කමකින් ඇඟිලි ඉවත්කළ දෙදරු මවකට රෝද පුටුවක් පරිත්‍යාග කිරීම.
- 2020 සැප්තැම්බර් 19 මෙත් සවිය සියලු කමිටු හා එකව මරණයට කැපවූ කිරි ගවයන් 8 දෙනෙකු නිදහස් කර ඇත. දුෂ්කර හොරොව්පතාන සුහද ගම ප්‍රදේශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් 6 කට කිරි විකුණා ජීවත්වීමට ලබා දීම.
- පරදුව තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ කුල දරුවන් සසුන්ගත් වී පිරිවෙන් අධ්‍යාපනය සිදුකළ හැකි පරිදි භික්ෂූන් 15 නමක් උදෙසා ඉදිවන, "මෙත් සවිය සාමණේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ" අවශ්‍ය කුටි ඇතුළු සියලුම යටිතල පහසුකම් ගොඩනැගීමට මෙත්සවිය කළුතර ශාඛාව සමග එක්ව කටයුතු කිරීම.
- මෙම සිරි සදහම් ආරාමය අසල ඉදිවන ආර්ථික අපහසුතා ඇති පවුල්වල දරුවන් උදෙසා ගොඩනැගෙන "මෙත් සවිය කළුතර පෙර පාසල" ඉදිකිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වීම.



## මෙත් සවිය වෙබ් කමිටුව

මෙත්සවිය වෙබ් කමිටුව වන අපට 2020 වසර නව අත්දැකීම් රාශියක් ලබාගැනීමට හැකි වූ වසරක් විය. ඒ වෙන කිසිවක් නිසා නොව කොවිඩ් - 19 වසන්ගත තත්වයත් සමග රට තුල ඇතිවූ තත්ත්වය මත වෙබ් අඩවි හරහා තොරතුරු දැනුම් දීමත්, අධ්‍යාපන කටයුතු බෙදාහැරීමත් ආදී නව අන්තර්ජාල නැඹුරුතාවයන් සඳහා අපගේ වෙබ් අඩවිය බලගැන්වීමට අවශ්‍ය මුලික අදියරේ කටයුතු සකස් කිරීමට අපට හැකිවීමයි. මේ අනුව යමින් මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණන්ගේ මගපෙන්වීම මත අප කමිටුව මෙත්සවිය වෙබ් අඩවිය නව අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස නැවත නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී. කමිටුවේ සියළුම සාමාජිකයින්ගේ සහයෝගය ඇතිව මේ වන විට නව වෙබ් අඩවිය, මෙත්සවිය සාමාජිකයින් මෙන්ම සමස්ත ප්‍රජාවටම විවෘත කිරීමට අවශ්‍ය සියලුම කටයුතු මේ වනවිට සුදානම් වෙමින් පවතී.

මෙත්සවිය කළුතර සදහම් අරණ සහ නොමිලයේ පවත්වාගෙන යාමට සැලසුම් කර ඇති පෙර පාසලේ වෙබ් පිටු ද මේ වනවිට සකස් කෙරෙමින් පවතින අතර සදහම් අරණ සමාරම්භක දින වන විට එම වෙබ් පිටු ද සමස්ත මහජනතාවට විවෘර්ත කිරීමට අප කමිටුව සුදානම් කර ඇත.

කෝවිඩ් 19 ව්‍යසන තත්වයන් තුල සමස්ත සමාජයටම සංචරණ සිමාවන් පනවා තිබූ අවදියේ ජාත්‍යන්තර වෙසක් දිනය නිමිති කරගෙන බුද්ධාලම්බන ප්‍රීතිය සමරනු වස් මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණන්ගේ මගපෙන්වීම මත අප කමිටුව මගින් සංවිධානය කරන ලද මෙත් සවිය ශ්‍රව්‍ය දෘශ්‍ය වෙසක් කලාපය දෙස් විදෙස් ප්‍රජාව අතර ඉමහත් ගෞරව ආදරයට පත් විය. දහස් සන්ක්‍යත පිරිස් වෙසක් කලාපය නැරඹීම සඳහා අප වෙබ් අඩවියට පිවිස තිබූ බවට අදාල දත්ත විශ්ලේෂණ ඔස්සේ අපට දැක ගන්නට හැකි විය.

මේ සියලූ දෙයට අමතරව මෙත්සවිය දෛනික නිවේදන සහ අනෙකුත් වැඩසටහන් විස්තර ප්‍රමාදයකින් තොරව වෙබ් අඩවිය ඔස්සේ ලබාදීම සඳහා අප කැප උන අපගේ වෙබ් කමිටුවේ සියලූම සාමාජිකයනුත්, මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණනුත්, නන් අයුරින් උපකාර කල සියලූ දෙනාත් මේ අවස්ථාවේදී කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

## පුණ්‍යානුමෝදනා

**පහත වැඩසටහන් සඳහා ආධාර පරිත්‍යාග ලබා දුන් සුපිංවතුන් හට මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

### 2021 ජනවාරි පළමු වන දා ගංඟාරාම විහරස්ථානයේ වසරේ ප්‍රථම හීල් දානමය පින් කමට දායක වූ සුපින්වතුන්...

- අචිනි රණසිංහ මෙනවිය - පිරිකර සඳහා රු. 30,000/-
- නිලූකා මෙනවිය රු. 10,000/-
- අශෝකා ජයතිලක මිය රු. 5,000/-
- විශ්වනාත් අපෝන්සු මයා රු. 5,000/-
- සංඛ්‍යා පද්මකුමාරි රු. 3,000/-
- නීතිඥ දීපිකා මිය රු. 2,500/-
- පෙරේරා මහතා රු. 1,000/-
- මංජුල මහතා රු. 1,000/-

**සකසන ලද ආහාර ලබාදුන් සුපින්වතුන්**

- හේමන්ති මිය
- සෝමා දීගල්ල මිය - වේනුක මහතා
- පියල් මහාතා - සංජානා මිය
- දිල්කි මිය - සඳමාලි මෙය
- පියුමාලි මිය - චමිපාවෝ මෙය
- නේපාලි මිය (විශේෂ) - නිරෝශා සෙව්වන්දි
- චින්තක මහතා - අමල් බණ්ඩාර මහතා
- රේණුකා මිය ඇතුළු පිරිස - පළතුරු
- විජේතුංග මිය - මිල්ඩා පෙරේරා (අටපිරිකර)
- වික්‍රම මහතා

[redacted]

- මහාචාර්යය චන්දන ජයරත්න මහතා රු. 20,000/-
- රංජනී උඳුගොඩ මිය රු. 10,000/-
- විජේතුංග මිය රු. 10,000/-
- මාලනී මුදුන්කොටුව මිය රු. 2,000/-
- තිළිනි මෙය රු. 1,000/-
- අතුල නානායක්කාර මයා රු. 500/-
- අයලෝකා කුමාරි මිය රු. 500/-
- ලලන්ති සොයිසා මිය රු. 500/-
- සුභද්‍ර කරුණාරත්න මයා රු. 500/-
- තෙරුනි මෙය රු. 500/-
- තමාරා මිය රු. 500/-
- සී. සමරනායක මයා රු. 500/-
- පුණයා නිශාන්ති මිය රු. 100/-
- සුනිල් හේවාවසම් මයා රු. 250/-
- ලංකා පද්මිණි මිය රු. 500/-

**මෙත් සවිය කාන්තා කමිටුව මගින් 2020 / 07 / 12 - 2020 / 09 / 20 දින දක්වා භාවනා වැඩසටහනට සහභාගී වන යෝගීන්හට ගිලන්පස / තේ පැන් සැපයීමේ පුණ්‍යකර්මයට දායකත්වය ලබා දුන් සුපින්වතුන්.**



**2020/07/12** : රුක්මල් හිරෝෂන් සිරිවර්ධන
**2020/07/26** : අමල් බණ්ඩාර
නොවැම්බර් කණ්ඩායම
පුණ්‍යා නිශාන්ති
ඉසුරිකා
නිහාල් අතාවුදගේ
ලතීෆ්
නවිදු
දුමින්ද
චමත් සඳරු
නන්දනී
සුනන්දා පරණමාන
**2020/08/09** : පූර්ණා තනූජා නව යුවළ
**2020/08/16** : නිමේෂ්
**2020/08/23** : දුල්වල මහත්මිය
**2020/08/30** : සොමයා
කාවින්‍ය
සංදීපා
**2020/09/06** : සන්ජානා මෙනෙවිය
**2020/09/13** : සඳමාලි
සන්ජානා
**2020/09/20** : චම්පිකා අධිකාරි
කේ. ඩී. එම්. උපෙක්‍ෂා
හසිත

# ගුරු පුදට මල් මිටක්

නමෝ බුද්ධාය!

ගීතය

බෝසතුන් ගුණ රුව පිරි - පින්කෙත රජ පිරුවැති
සිත් පිවතා සඳු දෙව්ලොව වන්
අපට මෙලොව කැඩපත විතුරු
චන්ද්‍රා ජයරත්න මැතිණි
පා පියුම් වඳිමි බැතියෙන - පා පියුම් වඳිමි!

සම්මා ජීවිකා සැමට බවදාන් දී
කරුණු වඩා පිවතා මග හෙළිකර දී
කුසල සලන්නා මුව ගොබ හසරැලි මවනා
මිනිසත් වෙසින් උපන මැණි දෙව්ලොව අගනා

මෙත් සවියට උපන් දී - ඒ දරුවාට ජීවනය වී
විශ්වයේ හඬුගා නුවන්ලොව කොරතුරු ගොනොනා
බල ඇසුරට පින්කම අපි ආසිරි ගෙනෙමු
සවිය බලය දිගු ආයුෂ ඔබහට පතමු ||

වෝලියනා සෙනරත්

---

ගරු, චන්ද්‍රා ජයරත්න මැතිතුමා,
මෙත් සවිය මනස අබාධිත සංවර්ධන
මෛත්‍රී සංසදය,
බොරැල්ල,
කොළඹ 08.

ස්තූති පූර්වක ඇගයීමයි!

ගරු මැතිණියනි,

කොවිඩ් 19 වසංගතය පවතිනවිට කලි ජීවන-රැකියාව අහිමිව ඉතා දුෂ්කර අවස්ථාවක ගත කරන 38/5958 වන මා හට ඔබ තුමිය කලින් රු 6000/- ක මුදල පරිත්‍යාගය ඉතා අගය කොට සලකන අතර අවස්ථානුකූලව එම මුදලේ වටිනාකම මිල කල නොහැකි බව ප්‍රකාශ කරමි. බලාපොරොත්තු වූ මුදලක් වැඩියෙන් වූ ඔබ පරිත්‍යාගය දුටුමෙන් ඇතිවූ සතුට සැබෑ විශාල වේ. ඒ නිසා ඔබතුමියට අනුමෝදන් වේවා! නිදුක් නිරෝගී සුවය සමගින් ශක්තිය ධෛර්යය ලැබේවා! ඔබතුමන් බලාපොරොත්තු වන මාර්ගයට ඉතා ඉක්මනින් ලගාවීමට හැකි වේවා! තෙරුවන් සරණයි!

---

Date 1/01/21

චන්ද්‍රා ජයරත්න මැතිතුමනි,

මට පෙර උපන් පෙර, ජනක,

2018/3/20 දින හොඳින ලෙස අප දැනගත් ප්‍රවෘත්තිය ඉතා කනගාටුවට පත්විය. හදවතේ භාගයක් පෝ ගිණීම වන බලට පෙරළිය නොහැකි කරුණ. සිංගප්පූරුවේ මෙල්බර්න් නුවර පිහිටි ආරෝග්‍ය ශාලාවේ සිට හැවරඩ් සිංහලි ප්‍රමුඛ දුෂ්කර්ම රෝගිය වැළඳී ඇති බවත්, ස්ටීරොයිඩ් ශරීරගත වීම නිසා එම රෝගයට ප්‍රතිකාර ද කළ නොහැකි තත්වයක් උද්ගත වී තිබුණි. සිංගප්පූරුව දැඩි සත්කාර ඒකකයේ දවස් හතරක් පමණ සිටිනි පුතු පසුවන විටදී අපි ඔබතුමා හමුවීමට පැමිණියෙමු.

ඔබතුමාගේ ආධ්‍යාත්මික ශක්තියෙන් රෝගී සිට අපට කළ යුතු පුණ්‍යකර්මයන් (බුදු දහම අනුව) නියාමනය ලදී. එමෙන්ම දින තුනක් ඔබතුමා විසින් සෙත්කරන බෝධි පූජා පවත්වන ලදී. එය අපට ඉතා සැනසීමක් විය. අප ද නොපමාව ඔබතුමා රැගෙන ලද බෝධි පූජාවන් පැදුරින් පන්සලට ගොස් සිදු කරන ලදී. ඔබ-තුමා සෙත් කිරීමට පටන් ගෙන දින 1½ ක් ගත-වන මොහොතේ දී ඉතා යහපත් ප්‍රතිඵල වෛද්‍ය සහෝදරයාගෙන් දැන ගන්නට ලැබුණි. එනම්, දරුවාට සිහිය ලැබී ප්‍රතිකාර කරගැනීමට හැකි තත්වයට පත්වී ඇති බවයි.

එරට වෛද්‍යවරුන්ට දැඩි සත්කාර ඒකක-යේ ප්‍රතිකාර ලබමින් සිටියදී (අපේ පුතාට) වෙනත් රෝහලක උදුරු ඒකකයකට හෙළිකොප්ටරයකින් රැගෙන යාමට අවශ්‍ය වූව ද දරුවා පසු වූ තත්වය මත එය ද සිදුකළ නොහැකි වී ඇත. එවැනි තත්වයක පසු වූ අපේ සිංහලි පුතුට සිහිය ලැබී (ගෙනයාමට) ප්‍රතිකාර කළ හැකි තත්වයට පත්වූයේ ඔබතුමාගේ සෙත් කිරීමේ ප්‍රතිඵල-යක් නිසා බව අප පවුලේ සියලු දෙනාම දැඩිව විශ්වාස කරමු. දිනෙන් දින දරුවාගේ තත්වය යහපත් අතට හැරී දැනට සුවය ලැබී පාසැල් යාමට හැකිවී ද දරුවාට ලැබුණි. පෙර උත් ආරම්භයට ප්‍රතිකාර කිරීමට සිදුවිය.

රෝගී සිටි අපගේ ද මානසික ශක්තියක් කර ගැනීමට ඔබතුමාගෙන් ලද උපදෙස් ද අපට විශාල ශක්තියක් විය. ඔබතුමාගේ ඇසුර ලැබීමට අපද සසරේ විශාල පුණ්‍ය කර්මයක් සිදුකර ඇත.

ඔබතුමාගේ පාරමිතා ධර්මයන් සම්පූර්ණ වී උතුම් බුදුබව ලැබීමට මේ විට රැක්ක ප්‍රාර්ථනා වේවා! ඔබතුමා ඇතුළු පවුලේ සියලු දෙනාම නිදුක් නිරෝගී වේවා! දීර්ඝායු ලැබේවා! දිනෙන් දින මෙත් සවිය ශක්තිමත් වේවා!

මෙහි හයවන කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

**9 වන කොටස...**



**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ**
**ලිපියක් ඇසුරිනි.**

## 34. පාපිච්ඡතා

නැති ගුණ දැක්වීමේ ආශාව, නැති ගුණ දක්වා ගිහියන් පහදවා ප්‍රත්‍යයන් ලබා ගැනීමේ ආශාය පාපාච්ඡතා නම් වේ. මෙය පැවිද්දන්ට ඇතිවන ක්ලේශයකි. ලාභ ප්‍රයෝජන ලබනු සඳහා නැති ගුණ පෙන්වන ගිහියන්ට ද මෙය ඇත. පාපාච්ඡතාව ඇති භික්‍ෂු තෙමේ තමාවත් පිළිවෙත් නො කරන කිසි ශ්‍රද්ධාවක් නැති ව සිට ම මිනිසුන් පැමිණෙන අවස්ථාවන්හි තමාගේ ශ්‍රද්ධාවත් බව දක්වා ඔවුන් රවටනු පිණිස ඡතකඩක් ගෙන විහාර චෛත්‍ය බෝධි සමීපයෙහි හැසිරෙයි. සෑමලු බෝමලු හැරදීම කරයි, කසළ ඉවත් කරයි. බෝධියට පැන් වත්කරයි. මලසුන් පිරිසිදු කරයිත. තමා භාවනා නො කරතත් භාවනා කරන ආසන, භාවන කරන ස්ථාන, සක්මන්මලු පිළියෙල කර තබා ගනී. තමා සිල්වතකු නො වීම අන්‍යයන් හමුවෙහි මිනිසුන්ට ඇසෙන සේ විනය ගැන කථා කරයි. අන්‍යයන් කරන වරදවල් ගැන තමාගේ සංවේගය ප්‍රකාශ කරයි. ශාසනයේ පිරිහීම ගැන කථා කරයි. ශාසනය දියුණු කිරීමේ වැඩ යෝජනා කරයි. තමා නූගතකු වුව ද උගත් බව පණ්ඩිත බව දැක්වීම පිණිස ''අභවල් පිරිවෙනට, අභවල් විද්‍යාලයට මා පත් කර ගැනීමට කථා කළා ය. ඕවාට ගියාම භාවනාවක් කරන්නටවත් අවකාශයක් නො ලැබෙව නිසා මා ගියේ නැත. දැනට පණ්ඩිතයෝ ය උපාධිදරයෝ ය කියා සිටින බොහෝ දෙනා ඔවුන්ගේ නොයෙක් ප්‍රශ්න විසදා ගැනීමට පැමිණෙන්නේ අප වෙතය'' යනාදිය කියයි. තමා විවේකකාමියකු අල්පේච්ඡයකු බව හඟවීම පිණිස නගරයක ගමක ජනාකීර්ණ පන්සලක වෙසෙමින් පැමිණෙන ජනයාට ''අපට වී ඇත්තේ මහා කරදරයෙක, මෙවැනි ජනාකීර්ණ තැන්වල විසීම අපගේ වැඩවලට බාධාවෙක, අපට වුවමනා ආරණ්‍යයක හෝ එවැනි විවේක ස්ථානයක හෝ විසීමය. එහෙත් මේ මිනිසුන් අපට එයට ඉඩ දෙන්නේ නැත. ඒ නිසා මෙහි රැඳී සිටින්නට සිදු වී තිබෙනවාය'' යි කියා මෙසේ මිනිසුන් පහදවා බොහෝ ප්‍රත්‍යයන් ලබා ගෙන ඒවා පමණ ඉක්මවා පරිභෝග කරමින් විසීම පාපාච්ඡ භික්‍ෂුවගේ ස්වභාවය ය. පාපාච්ඡතාව නපුරු පාපායෙකි. මෙකල රහත් බව අඟවන කුහකයන් ගැන අසන්නට ලැබේ. බොහෝ රහතන් විසූ අතීත කාලයෙත් ඇතැම් කුහකයන් ප්‍රත්‍යය ලැබීම සඳහා නැති රහත්කම් ද මිනිසුන්ට ඇඟවූහ. විභංග අටුවාවෙහි පාපාච්ඡතාවෙන් මඩනා ලදුව මිනිසුන්ට රහත් බව අඟවමින් විසූ කුහක භික්‍ෂූන් දෙදෙනෙකුගේ කථා දක්වා ඇත. ඒවා මෙසේය.

එක් කුහක භික්‍ෂුවක් ඔහු වෙසෙන කාමරයේ මහා සැළියක් වළලා තබා ගෙන මිනිසුන් එනවිට එහි සැඟවෙයි. මිනිසුන් අවුත් හාමුදුරුවෝ කොහිදැ යි ඔහුගේ අනුවරයන්ගෙන් අසන විට හාමුදුරුවෝ කාමරයෙහි වැඩ සිටිති යි කියති. මිනිසුන් කාමරයට පිවිස බලා භික්‍ෂුව නොදැක පිටතට අවුත් එහි නැත ය යි කියති. ඒ හඬ ඇසෙන විට භික්‍ෂුව සැළියෙන් පිටතට අවුත් අසුනෙක්හි හිඳ ගනී. සෙස්සෝ මිනිසුන්ට ''හාමුදුරුවෝ කාමරයේමය'' යි කියති. මිනිස්සු නැවත කාමරයට පිවිස බලති. අසුනක හිඳිනා භික්‍ෂුව ඔවුහු දකිති. මිනිස්සු භික්‍ෂුව දැක පුදුම වී ''නුඹ වහන්සේ දක්නට මඳකට කලින් අපි මෙහි පැමිණියෙමු ය. එහෙත් නොදුටුයෙමුය'' යි කියති. කුහක භික්‍ෂුව තෙමේ රහත් කෙනෙකැයි ඔවුනට හැඟවීම සඳහා ''භික්ෂූහු රිසි රිසි තැන්වලට යන්නාහ. භික්‍ෂූන්ගේ ගමන් ගැන නො ඇසිය යුතුය'' යි කියයි. මිනිස්සු මේ හාමුදුරුවෝ ඍද්ධිමත් රහත් කොනෙකැයි සිතා වඩ වඩා පූජා සත්කාර කරන්නාහ.

එක්තරා කුහක භික්‍ෂුවක් කඳුගැටයක් මත පන්සලක වෙසෙයි. පන්සලේ පිටුපස ප්‍රපාතයකි. ඒ නිසා ඒ පැත්තෙන් මිනිසුන්ට යාම ඒම නො කළ හැකි ය. කඳු බෑවුමේ වැටී තිබූ ගසක මුලක්, යට සම බිමට සම්බන්ධ වී පිහිටා තිබුණේ ය. කුහක භික්‍ෂුව පිණ්ඩපාතාදිය සඳහා තමාට ආරාධනා කරන්නට එන මිනිසුන් පිටත් කර යවා මම පසුව එන්නෙමියි කියා ඒ මුලේ එල්ලී කන්දෙන් බැස ඔවුනට පළමුව ගම දොරට ගොස් සිටී. මිනිසුන් විසින් නුඹ වහන්සේ අපට පෙර මෙහි පැමිණියේ කෙසේදැයි අසන කල්හි ''භික්ෂූහු රිසි රිසි තැන්වලට යන්නාහ. භික්‍ෂූන්ගේ ගමන් ගැන නො ඇසිය යුතුය'' යි කියයි. මිනිස්සු මුන් වහන්සේ රහත් කෙනෙකැයි සිත වඩ වඩා පූජා සත්කාර කරති. කුහක මහණාගේ රහස දැනගත් අයෙක් රහසිගතව මුල කපා භික්‍ෂුව බස්නා කල්හි කඩා හැළෙන පරිදි මඳක් ඉතිරි කොට තැබීය. එදින රහත් බව පෙන්වීමට ගිය කුහක භික්‍ෂුව ප්‍රපාතයෙන් වැටී පාත්‍රය ද බිඳගෙන පලා ගියේ ය.

ඊළඟ සගරාවෙන්... **35. සිංගං**

**මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ**

**ගරු ජ්‍යෙෂ්ඨ පැවිදි අනුශාසක,**

ශ්‍රී සුමංගල විද්‍යාවතංස, නේපාලයේ චාරුමතී රාජමහා විහාරාධිපති, බුරුමයේ මියන්මාර් ශ්‍රී ලංකා බෞද්ධ මධ්‍යස්ථානාධිපති හා ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධම්මාශ්‍රමාධිපති, හෝමාගම ශ්‍රී ලංකා බෞද්ධ හා පාළිවිශ්වවිද්‍යාලයෙහි මහෝපාධ්‍යාය, ධර්මපාල වංශාලංකාර සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටක විශාරද, ප්‍රවචන කීර්ති ශ්‍රී සාසන සෝභන, අග්ගමහා පණ්ඩිත, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක ධුරන්ධර,



# අපවත් වී වදාල අති පූජ්‍ය

# කොටුගොඩ ධම්මාවාසාභිධාන

## උත්තරීතර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ


## පැතූ බෝධියකින් අමා මහ නිවන් සුව ලබත්වා!













# ආවාස පූජාව

බොරැල්ල ශ්‍රී ලංකාරාමය විහාරස්ථානයෙහි විහාරාධිපති ඤාණ ස්වමීන්ද්‍රයන්වහන්සේට ආවාසයක් තනා පූජා කිරීම 24.02.2021 දින කොවිඩ් සීමා යටතේ සිදු කරන ලදී.

මෙම පුණ්‍ය කටයුත්තට මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් රු. 215,000/- හර්ෂ පෙරේරා මහතා රු. 100,000/- සහ තිවංක වික්‍රමසිංහ මහතා රු. 100,000/- ප්‍රධාන දායකත්වය දරණ ලදී. මුළු වියදම රු 415,000/- කි. මෙත්සවිය වෙනුවෙන් මෙම අටමහා කුසලයට දායක වූ සියළු සාමාජිකයිනට අපගේ මෙත්සිත් පෙරදැරි පුණ්‍යානුමෝදනා කරන්නෙමු.









# මෙත් සවිය


# සදහම් අරණ

## භික්ෂු පුහුණු මධ්‍යස්ථානය පිහිට වූ පසු ව අනාගතයේ මෙසේ දිස් විය හැකිය.

කළුතර, පරදුව, තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ, කුල දරුවන් සසුන්ගන්වා පිරිවෙන් අධ්‍යාපනය සිදුකළ හැකි පරිදි භික්ෂූන් 15 නමක් උදෙසා ඉදිවන, "මෙත් සවිය සාමණේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ" අවශ්‍ය කුටි ඇතුළු සියලුම යටිතල පහසුකම් ගොඩනැගීම මෙත් සවිය අසරණ සරණ කමිටුව - මෙත් සවිය කළුතර ශාඛාව සමග එක්ව කටයුතු කිරීම.













# මෙත් සවිය

# ළදරු පාසල

කළුතර, පරදුව, තෝරගල්ල සිරි සදහම් අරණ විහාරස්ථ භූමියේ,
ආර්ථික අපහසුතා ඇති පවුල්වල දරුවන් උදෙසා
මෙත් සවිය විසින් ගොඩනගන

## "මෙත් සවිය කළුතර පෙර පාසල"

(ගොඩනැගිලි සහ ක්‍රීඩා උද්‍යානය සඳහා පාර්ශවික දායකත්වය මැද කොළඹ රොටරි සමාජය මගිනි.)













ප්‍රාදේශීය දිළිඳු පවුල් වල කුඩා දරුවන් "මෙත් සවිය පෙර පාසල" ට ඇතුලත් කර ගැනීම.














2020 අගෝස්තු මස 02 වන දින මහ සභා රැස්වීම දැඩි කොවිඩ් නීති රීති යටතේ,
සීමිත පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී, පූජ්‍ය ගොම්බද්දල ධම්ත ස්වාමීන් වහන්සේ විසින් ධර්ම දේශනාවක් ද පවත්වන ලදී.



බොරැල්ල වැඩිහිටි නිවාසයේ තීන්ත ආලේපයෙන් පසු, කාන්තා කමිටු උප සභාපතිනි - හේමන්ති පෙරේරා, රංජනී උදුගොඩ සහ විජේතුංග යන මහත්මීන්ගේ
ප්‍රධානත්වයෙන්, මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ උපන්දිනය වෙනුවෙන් ආශිර්වාද පතා වැඩිහිටියන්ට ඇඳුම් පැළඳුම් පිරිනමන ලදී. (2020/09/20)



2020 අගෝස්තු මස 19 වන දින මෙත් සවිය පර්යේෂණ හා වෙබ් කමිටුව විසින්, "මිතුරු මිතුරෝ සංවිධානය" වෙනුවෙන්
මත් ද්‍රව්‍ය නිවාරණයට උපකාර පිණිස ජංගම දුරකථන සඳහා යෙදවුමක් (App) නිර්මාණය කිරීම ආරම්භ කර ඇත.




හොරොව්පතාන ප්‍රදේශයේ සුහද ගම්මානයේ දුගී දුප්පත් පවුල් වල සිටින, දරුවන් කිහිප දෙනෙකු හට අධ්‍යාපනයට අවශ්‍ය පාසල් උපකරණ හා අත්‍යවශ්‍ය
දෑ පරිත්‍යාග කිරීම මෙත් සවිය කාන්තා කමටුවේ සංවිධානයෙන් සාමාජිකයින් කීප දෙනෙකු විසින් සිය ධන පරිත්‍යාගයෙන් සිදු කරන ලදී. (2020/03/07)



මෙත් සවිය සනීපාරක්ෂක කටයුතු සඳහා දායක වන රීටා ආච්චිගේ අබලන් ව වාසයට නුසුදුසුව තිබූ නිවස, නැවත වාසයට සුදුසු පරිදි
ප්‍රතිසංස්කරණය කර පරිත්‍යාග කිරීම අසරණ සරණ කිමිටුවේ අනුග්‍රහයෙන් සිදු කරන ලදී. (2020/09/13)



රෝගී තත්ත්වයට පත්ව ඇවිදීමට නොහැකිව අසරණව සිටි මවකට රෝදපුටුවක් පරිත්‍යාග කිරීම
2020 සැප්තැම්බර් 13 දින අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.




සිදුහත් කුමරුගේ කිරි මව් වු මහා ප්‍රජාපති ගෝතමිය විසින් පසු කලෙක බුදුරජාණන් වහන්සේට පූජා කළ සිවුරක් බුදුරජාණන් වහන්සේ විසින් තෙවරක්ම ප්‍රතික්ෂේප කර විය මහා සංඝරත්නය වෙත පුජා කරන ලෙස උපදෙස් දුන්හ. මින් දුකට පත් ප්‍රජාපති ගෝතමිය දැක තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගෙන් එසේ කිරිමට හේතුව විමසු විට එසේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට පිළිගැන්විමෙන් පෞද්ගලිකව බුදුරජාණන් වහන්සේට පුදනවාට වඩා කුශල් අත්වන බව පෙන්වා දුන්හ. ඉන් පසු දාන අනිසංස දක්වන දක්ෂිණ විභංග සූත්‍රය වදාල සේක. ආනන්දය,පෞද්ගලික දාන 14 කි.

### පෞද්ගලික දාන 14

01. තථාගත අරහත් සම්‍යක් සම්බුදූන් වහන්සේට දෙන දානය ප්‍රථම පෞද්ගලික දානයයි.
02. පසේ බුදු කෙනෙකුන්ට දෙන දානය දෙවෙනි පෞද්ගලික දානයයි.
03. තථාගත ශ්‍රාවක රහතන් වහන්සේට ,දෙන දානය තුන්වෙනි පෞද්ගලික දානයයි.
04. රහත් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට දෙන දානය .
05. අනාගාමියෙකුට දෙන දානය
06. අනාගාමී ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට දෙන දානය.
07. සකෘදාගාමීයෙකුට දෙන දානය.
08. සකෘදාගාමී ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකට,
09. සෝවාන් වු කෙනෙකුට,
10. සෝවාන් ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට,
11. කාමයන්හි වීතරාගී බාහිර අයෙකුට,
12. පෘථග්ජන සිල්වතෙකුට,
13. පෘථග්ජන දූශ්ශීලයෙකුට,
14. තිරිසන් සතෙකුට දෙන දානය පෞද්ගලික දාන 14 යි.

"ආනන්දය'' තිරිසන් සතෙකුට දීමෙන් සිය ගුණයක්ද පෘථග්ජන දුශ්ශීලයෙකුට දීමෙන් දහස් ගුණයක්ද, පෘථග්ජන සිල්වතෙකුට දීමෙන් සිය දහස් ගුණයක්ද, කාමයන්හි වීතරාගී බාහිර තවුසෙකුට දීමෙන් කෝටි ශත සහස්‍ර ගුණයක්ද සෝවාන් ඵලය සාක්ෂාත් කරන්නෙකුට දීමෙන් අසංඛෙය්‍ය අප්‍රමේය අනුසස් ද බලාපොරොත්තු විය හැකිය.

එසේ නම් සෝවාන් සකෘදාගාමී අනාගාමී අරහත් පසේ බුදු හා සම්මා සම්බුදුවරයෙකුට දෙන දානයෙහි ආනිසංස කාට කිව හැක ද?"

### ආනන්දය ,සංඝගත දක්ෂිණා 7 කි.
### සංඝගත දක්ෂිණා 7

01. බුද්ධ ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී සංඝයාට දෙන දානය ප්‍රථම සංඝගත දක්ෂිණාවයි.
02. බුදුන් පිරිනිවායින් පසු භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට දෙන දානය දෙවෙනි සංඝගත දක්ෂිණාවය.
03. භික්ෂු සංඝයා විෂයෙහි දෙන දානය තුන්වෙනි සංඝගත දක්ෂිණාවයි.
04. භික්ෂුණී සංඝයා වෙත දෙන දානය හතරවෙනි සංඝගත දක්ෂිණාවයි.
05. මට මෙපමණ භික්ෂු, භික්ෂුණී ඕනෑ යයි ගණන් නියම කොට දෙන දානය පස්වෙනි සංඝගත දක්ෂිණාවයි.
06. මට මෙපමණ භික්ෂු සංඝයා ඕනෑ යයි ආරාධනා කොට දෙන දානය හයවෙනි සංඝගත දක්ෂිණාවයි.
07. මට මෙපමණ භික්ෂුණී සංඝයා ඕනෑ යයි ආරාධනා කොට දෙන දානය හත්වෙනි සංඝගත දක්ෂිණාවයි.

ආනන්දය, සංඝයා උදෙසා අනාගතයෙහි ඇති වන කාසාව කණ්ඨකයන්ට දෙන දානයෙහි ද ආනිසංස අසංඛෙය්‍යය අප්‍රමෙය්‍යය යයි කියමි. එබැවින් කුමන විදියේ පෞද්ගලික දානයක් වුවත් ආනිසංස සංඝගත දක්ෂිණාවක ආනිසංස වලට වැඩි යයි මම නොකියමි. (නත්වෙවාහං ආනන්ද කෙනෙචි රියායෙන සංඝගතාය දක්ඛිණාය පටිපුග්ගලිකව දානං මහප්ඵලතරං වදාමි) ආනන්දය, මහා ප්‍රජාපතී ගෝතමියගේ අලුත් වස්ත්‍ර යුග්මය මා පිළිනොගත්තේ මා ඇතුළු සංඝයාට දෙවීමෙන් ආනිසංස වැඩි කරවීම පිණිසයි. එසේ නැතිව ඇයට අහිතවත්කමක් නිසාවත්, ඇය කළ උපකාර අමතක කිරීමෙන්වත් නොවේ.

### දායකයා හා ග්‍රාහකයා යන දෙදෙනාම ගුණවත් වීම නිසා ඉතා මහත් ඵල දානයක් ඇත්තේ ය.

(1) සිල්වත් දායකයෙකු විසින් දුශ්ශීල ප්‍රතිග්‍රාහකයෙකුට දෙන දානය දායකයාගේ යහපත් බව නිසා මහත්ඵල වේ. වෙසතුරු රජතුමා හට නිර්ගුණ වූ පූජකයාට දන් දී පොළොව පවා කම්පා කළ හැකි වූයේ ද ලොව්තුරු බුදු බව ලැබිය හැකි වූයේ ද දායකයා ගේ ගුණය නිසා දානය මහත් ඵල වන බැවිනි.

(2) දුශ්ශීලයෙකු විසින් සිල්වතෙකුට දෙන්නා වූ දානය ප්‍රතිග්‍රාහකයාගේ ගුණය මහත්ඵල වේ. කැළණි ගං මෝය අසල විසූ කෙවුලෙක් "දීඝසෝම" නම් වූ සිල්වත් භික්‍ෂුන් වහන්සේ කෙනෙකුට තෙවරක් පිණ්ඩපාතය දී හේ මරණාසන්නයේ දී "දීඝසෝම තෙරුණ් වන්සේට දුන් දානය මා ගලවා ගන්නේ ය" යි කියා කාලක්‍රියා කොට දෙව් ලොව උපන්නේ ය.

(3) දුශ්ශීලයෙකු විසින් දුශ්ශීලයෙකුට ම දෙන දානය මහත්ඵල නොවන දානය යි. වර්ධමාන නම් ගම විසූ වැද්දෙක් ඥාති ප්‍රේතයෙකු උදෙසා දුසිල් මහණකට තෙවරක් ම දන් දින. ප්‍රේතයාට පින් නොලැබිණ. තුන්වන වරදී 'මගේ දානය දුශ්ශීලයෙක් පැහැර ගන්නේ ය.' යි ප්‍රේතයා කෑ ගැසීය. පසුව සිල්වතකු සොයා දන් දි පින් දුන් කල්හි ප්‍රේතයාට පින් ලැබිණි.

(4) සිල්වතකු විසින් සිල්වතෙකුටම දෙන දානය උත්තම වේ. දෙපක්‍ෂය ශුද්ධ ගුණවත් නිසා ඒ දානය විශේෂයෙන්ම මහත්ඵල වේ.

## ත්‍රිවිධ දාන සම්පත්තිය

දන් දීම කුඹුරු වැපිරීමක් වැනි ය. කුඹුරක් වැපිරීමෙන් බොහෝ ඵල ලැබෙන්නේ කුඹුරය, වපුරන වීය ය. ගොවියා ය යන තුනම යහපත් වූ කල්හි දන් දීමේ දී ප්‍රතිග්‍රාහකයා කුඹුර වැනි ය. දෙන්නා වූ වස්තුව වපුරන විය වැනි ය. දායකයා ගොවියා වැනි ය. හොඳ කුඹුරක හොඳ වියත් හොඳ ගොවියෙකු විසින් වපුල හොත් මහත් අස්වැන්නක් ලැබෙන්නාක් මෙන්, යහපත් කුඹුර වැනි වූ ධර්මයෙන් උපයා ගත් වස්තුවක් කුඹුරු වැඩ හොඳින් දත් අනලස් ගොවියෙකු වැනි වූ කම්පල හා ප්‍රතිග්‍රාහකයන්ගේ ගුණ දැන ගැනීමට සමර්ථ වූ ද චේතනාත්‍රය පිරිසිදු කර ගැනීමට සමර්ථ වූ ද දායකයෙකු විසින් දෙන ලදුයේ නම් එයින් බොහෝ අනුසස් ඇත්තා වූ මහත් වූ කුශලයක් ලැබෙන්නේ ය. කුඹුරු වැපිරීම ගැන කියන ලද කරුණු තුනෙන් එකක් මුත් නොමනා වුවහොත් එයින් ලැබෙන ඵලය හීන වන්නාක් මෙන් දන් දිම සම්බන්ධයෙන් කී කරුණු තුනෙන් එකකුදු හීන වුවහොත් පුණ්‍ය ඵලය ද හීන වේ. හීන වීම යයි කියනුයේ කිසිම ඵලයක් නොලැබී යාම නොව, ඵල අඩුවීම ය. හොඳම ප්‍රතිග්‍රාහකයෙකු සොයා ගෙන දන් දීම යහපති. එබැවින්,

**"විචෙය්‍ය දානං දාතබ්බං - යත්ථ දින්නං මහප්ඵලං**
**විචෙය්‍ය දානං දත්වාන - සග්ගං ගච්ඡන්ති දායකා"**
යනුවෙන් වදාරණ ලදී.

"යම් තැනකට දෙන ලද දානය මහත් ඵල වේ ද එතැන සොයා දන් දිය යුතු ය. විමසා දන් දීම හේතු කොට දායකයෝ ස්වර්ගයට යන්නාහ යනු එහි තේරුමයි.

**විචෙය්‍ය දානං සුගතප්පසත්තං - යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ**
**එතෙසු දින්නානි මහප්ඵලානි - බීජානි වුත්ථානි යථා සුඛෙත්තෙ"**

මේ ලෝකයෙහි යමෙක් දක්ෂිණෙය්‍යයෝ වෙත් ද ඔවුන් සොයා තෝරා ගෙන දන් දීම බුදුන්වහන්සේ විසින් පසස්නා ලද්දේය. යම් සේ යහපත් කුඹුරක වපුල වුය බොහෝ ඵල ගෙන දෙන්නේ ද එමෙන්ම තෝරා ගත් ගුණවතුන්ට දෙන දානය බොහෝ ඵල ගෙන දෙන්නේය' යනු එහි තේරුමයි.

**"කාලේ දදන්ති සප්පඤ්ඤා - වදඤ්ඤූ විතමච්ඡරා**
**කාලෙන දින්නං අරියෙසු - උජුභූතෙසු තාදිසු**
**විප්පසන්නමනා තස්ස - විපුලා හොති දක්ඛිණා"**

මසුරු මල දුරුකලා වූ දෙන ස්වභාවය ඇත්තාවූ නුවණැත්තේ දීමට සුදුසු කල්හි දන් දෙති. කාය වාචා චිත්ත වංකයන් ප්‍රහීන බැවින් අවංක වූ ඉෂ්ටානිෂ්ටයන්හි ඇල්ම හා කෝපය නැත්තා වූ ආර්‍යයන් කෙරෙහි ප්‍රසන්න සිත් ඇත්තාවූ යමෙක් දන් දේ ද ඔහුගේ දානය මහත්ඵල වන්නේ ය යනු ගාථාවෙහි අදහසයි.

## අසත්පුරුෂ දාන පස

**"පඤ්චිමානි භික්ඛවෙ, අසප්පුරිස දානානි, කතමානි පඤ්ච? අසක්කච්චං දානං දෙති, අචිත්තී කත්වා දානං දෙති, අනාගමන දිට්ඨිකෝ දානං දෙති, ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච අසප්පුරිස දානානි"**

යනුවෙන් අංගුත්තර නිකාය පඤ්චක නිපාතයෙහි අසත්පුරුෂ දාන පසක් දක්වා තිබේ. ඒ මෙසේය.

(1) ප්‍රතිග්‍රාහකයන්ට සුවසේ වැළඳිය හැකි වන පරිද්දෙන් සකස් නො කොට මනා කොට දෙන දානය එක් අසත්පුරුෂ දානයකි.

(2) දාන වස්තුව කෙරෙහි හා ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි ආදර ගෞරවයක් නැතිව දෙන දෙන දානය එක් අසත්පුරුෂ දානයකි.

(3) සියතින් නොදී වැඩකාරකාදීන් අනුන් ලවා දෙවන දෙන දානය එක් අසත්පුරුෂ දානයකි.

(4) නිතර නොදී නරක් වූ දෙයක් අහක දමන දමන්නාක් මෙන් කලාතුරකින් දෙන දානය එක් අසත්පුරුෂ දානයකි.

(5) මතු පුණ්‍ය ඵලය ලැබීමේ බලාපොරොත්තුව නැතිව දෙන දානය එක් අසත්පුරුෂ දානයකි.

දීමට පිළියෙළ කරන ආහාරය මනා වර්ණයෙන් හා ගන්ධයෙන් ද රසයෙන් හා ඕජාවෙන් ද යුක්ත කොට පිළියෙළ කිරීම දාන වස්තුවට ගෞරවාදර කිරීමය. එසේ නොකොට වැලිකැට ගල්කැට සහිතිව ලුණු ඇඹුල් නැතිව දානය පිළියෙළ කිරීම දාන වස්තුවට අනාදර අගෞරව කිරීමයි. දෙන කල්හි දීමට සුදුසු උත්තම ප්‍රතිග්‍රාහකයින් නො සොයා දුටු කෙනෙකුට දීම, වැඩ පාළු වන සැටියට බොහෝ දුර සිට සුළු දෙයක් දීම ද, තම තමන්ගේ තැන්වල සිසිල් සෙවනේ කරදරයක් නැතිව ආහාර ගන්නා භික්ෂූන්ට එයට ඉඩ නොදී දුර තද අව්වේ ගෙන්වා වෙහෙසවා දෙන දානය ද අසත්පුරුෂ දාන සංඛ්‍යාවට ඇතුළත් වන බව කිව යුතු ය.

දන් දෙන කල්හි ඒ දෙන දානය අසත්පුරුෂ දානයක් නොවී සත්පුරුෂ දානයක් වන සැටියටම දන් දීම කළ යුතු ය. දානය යහපත් වනුයේ ප්‍රතිග්‍රාහකයින්ට එයින් යහපතක් වන හැටියට දුනහොත් ය. ප්‍රතිග්‍රාහකයින්ට අලාභ හානි කරදර වන සැටියට දෙන දානයක් නොදීම ම යහපති. භික්ෂූන්ට දන් දෙන ඇතැම්හු තමන්ගේ දානය භික්ෂූන් බොහෝ ගණනක් ගෙන්වා ගෙන දෙන්නට කල්පනා කරනවා මිස, ඒවා පිළිගන්නට වඩින භික්ෂූන්ට වන කරදර අලාභ හානි ගැන කල්පනා නොකරති. දෙන දානයෙන් ප්‍රතිග්‍රාහකයාට ලැබෙන ලාභයට වඩා මහත් කරදරයක් අලාභයක් වේ නම්, ඒ දීමෙහි කිසි තේරුමක් නැත. දෙන අය විසින් බැලිය යුත්තේ බොහෝ දෙනෙකුට දීම ගැන නොව ප්‍රතිග්‍රාහකයින්ට පහසුවක ලාභයක් සුවයක් වන සැටියට ටික දෙනෙකුට වුවත් දීම ගැන ය. දන් දීමේ පරමාර්ථය අනුන්ට පහසුවක් ඇති කිරීම ය.

## අසත්පුරුෂ දානයේ විපාක

අසත්පුරුෂ දානය දුන්නවුන්ට එහි විපාක වශයෙන් ඔවුන්ගේ දානය සේම අයහපත් වූ භව භෝග සම්පත් ලැබෙන්නේ ය. ඔවුනට සංසාරයේ දී ලැබෙන්නේ මීයන්ගෙන් වේයන්ගෙන් මැස්සන්ගෙන් හානි වූ දේය. සමහරු දුශ්ශීලයන් කෙරෙහි සංඝයා උදෙසා දන් දෙන්නාහුය. ආනන්දය, එකල්හි ද මම සංඝගත දක්ෂිණාවේ ආනිසංස අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය වන බව පවසමි. ආනන්දය කිසිම ආකාරයකින් සංඝගත ක්ෂිණාවට වඩා පෞද්ගලික දානය මහත් ඵලතරය මම නොපවසමි යි තථාගතයන් වහන්සේ සාංඝික දානයේ ආනිසංසය වදාළ සේක.

## දුන් අත්බැවින් ම විපාක ලැබෙන දානය

වස්තු සම්පත්තිය ය. ප්‍රත්‍යය සම්පත්තිය ය. චේතනා සම්පත්තිය ය. ගුණාතිරේක සම්පත්තිය ය යන චතුස් සම්පත්තියෙන් යුක්ත දානය, දුන් අත් බැව්හි ම විපාක දෙන්නේ ය. වස්තු සම්පත්තිය යනු ප්‍රතිග්‍රාහකයා අනාගාමී වූ හෝ රහත් වූ හෝ කෙනෙකු වීම ය. චේතනා සම්පත්තිය යනු දීමට පූර්වයෙහි හා දෙන කල්හි ද ඉන් පසුව ද සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත කුශල චේතනා ඇති බව ය. ගුණාතිරේක සම්පත්තිය යනු ප්‍රතිග්‍රාහකයා එදින නිරෝධසමාපත්තියෙන් නැඟී සිටියෙක් වීම ය. මේ චතුස් සම්පත්තිය ලැබිය හැක්කේ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා හා ධ්‍යානලාභී අනාගාමීන් ඇති කාල වලදීය. චතුස් සම්පත්තියෙන් යුක්ත කොට දන් දුන් කල්හි ඇතමෙකුට ඒ ජාතියේ දී යම් කිසි අවස්ථාවක් ලැබේ.

චතුස් සම්පත්තියෙන් යුක්ත කොට මෙලොව ම විපාක ලැබෙන සැටියට දන් දීම පහසු කාර්‍යයක් නොවේ. අනාගාමීන් හා රහතුන් නො ලැබිය හැකි බැවින් මෙ කල එය නො කළ හැකි ය. දහස් ගණනක් රහතන් වහන්සේ වැඩ විසූ අතීතයේ දී ද මෙලොව විපාක ලැබෙන සේ දන් දිය හැකි වූයේ ඉතාම ටික දෙනෙකුට පමණකි. මෙකල දන් දෙන්නවුන්ට ඉහත ආත්ම භවයේ ලැබෙන ආනිසංස සර්වාකාරයෙන් නැත්තේ ම නොවේ. දන් දීමෙන් මෙලොව දී ලැබෙන අනුසස් විචාළා වූ සීහ සෙන්පතියාට, බොහෝ දෙනාට ප්‍රිය වීමය, සත් පුරුෂයන් විසින් භජනය කරනු ලැබීමය, කීර්තිය පැතිරයාම, නිර්භීත ව පිරිස් මැදට යා හැකි බවය යන ආනිසංස සතරක් මෙලොවදී ම ලැබෙන බව බුදුන් වහන්සේ වදාළ සේක. සැහැහයෙන් දන් දෙන පින්වතුන්ට නිරෝගී බව, සතුරු උවදුරු මඳ බව යනාදී තවත් අනුසස් ලැබෙන්නේ ය.

**අපවත් වී වදාළ රේරුකානේ චන්ද විමල හිමිගේ ලිපියක් හා පොත පත ඇසුරෙන් මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් මෙත් සවිය කලාපය සඳහා සකසන ලද ලිපියකි.**



ප්‍රාග් ඓතිහාසික

# පිළිකුත්තුව රජමහා විහාරය

**මෙත් සවිය මගින් මෙම විහාරස්ථානය වන්දනා මාන කිරීමට පැමිණෙන බැතිමතුන්ගේ පහසුව තකා, කාන්තා හා පුරුෂ දෙපක්ෂය සඳහා වැසිකිළි 8 කින් යුත් වැසිකිළි පද්ධතියක් තනා පූජා කර ඇත.**

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් සියනෑ කෝරළයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඌරුවල් පේරුවෙහි පිහිටා තිබෙන ප්‍රාග් ඓතිහාසික පුදබිමකි මෙම පිළිකුත්තුව රාජ මහා විහාරය. මෙම විහාරය මෙරට ලෙන් විහාර සම්ප්‍රදාය තුල ඉතා වැදගත් කමක් උසුලන ඓතිහාසික බෞද්ධ පුදබිමක් වෙයි.


අඩි 400 - 450 ක් පමණ උස කඳුගැටයක් පුරා අක්කර 250 ක් තරම් භූමි භාගයක පැතිරී තිබෙන මෙම විහාරයට අයත් භූමියෙන්, අක්කර 52 ක පමණ ප්‍රමාණයක් රජමහා විහාරය සතුව ද, ඉතිරි භූමි ප්‍රමාණයේ ඇති ස්මාරක පමණක් ද විහාරයට අයත්ව පවතියි. මෙරට වැඩිම ලෙන් සංඛාවක් සහිත විහාරස්ථාන අතරට අයත් තවත් විහාරස්ථානයක් ලෙසට ද, බස්නාහිර පලාතේ පිහිටි වැඩිම ලෙන් සහිත රජමහා විහාරය ලෙසට ද, මෙම භූමිය හැඳින්වෙයි. විහාරස්ථානයට උතුරින් යොන්ගම්මුල්ල ග්‍රාමය හා වාරණ විහාරය සහිත කඳු වැටියත්, දකුණින් වලගම්බා රජමහා විහාරයත්, නැගෙනහිරින් මාලිගාතැන්න ඓතිහාසික පුදබිමත් පිහිටා ඇත.

මිනිසා ගල්ලෙන් සිය වාසස්ථාන කොට ජිවත් වුයේ කුමන කාලයක සිටද එවැනි ප්‍රාග් බෞද්ධ යුගයකින් මෙම ස්ථානය ආරම්භ වු බවට සඳහන් කල හැකිය. මෙම පුදබිම මුල් කාලීන ආදී මානව ජනාවාසයක්ව පැවති බවට කරන ලද කැණිම් සාධක සපයයි. මහින්දාගමනයෙන් පසුව සිදු වු දියුණුවත් සමගම එතෙක් පැවති ගල්ගුහා වැස්සෙන් ආරක්ෂා වීමට හැකි පරිදි කටාරම් කොටවා සඟරුවනට පිදු බවට සෙල් ලිපි සාක්ෂි පෙන්වයි. එම කාලය දේවානම් පියතිස්ස රජ දවස බව පුරාවිද්‍යාඥයන්ගේ මතය වෙයි.

ක්‍රි.පූ 1 සියවසේ දි මේ භූමිය හා අවට වන පියස් තුල වලගම්බා රජු සැඟවී සිට සේනාව එකරාශි කොට නැවතත් අනුරපුර රාජධානියේ රජ වූ බවට ජනප්‍රවාදවල සඳහන් වෙයි. සැඟවී සිටි රාජකීයන්ගේ රාජාභරණ සැඟවූ නිසා පිළිකුත්තුව නාමය ව්‍යවහාර වු බවට එක මතයකුත් සැඟවී සිටි රාජකීයන්ට ඇඳුම් පිළි සැපයු ගම පිළිකුත්තුව වුවායැයි ද තවත් මතයකි.

පිළිකුත්තුව රජමහා විහාරය සහිත භූමියෙහි ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 3 වන සියවස පමණ තෙක් අතීතයට දිවෙන බව පැවසෙයි. ක්‍රිස්තු පූර්ව තුන්වෙනි සියවසේ දී මේ වන අරණ බෞද්ධ භික්ෂූන්ට භාවනානුයෝගීව සිටීමට සුදුසු වන පරිදි වැඩි දියුණු කොට තිබූ බව පැරණි පුරාවිද්‍යා ලේඛනවල සඳහන් වේ. ක්‍රිස්තු පූර්ව 3 වන හා ක්‍රිස්තු වර්ෂ 1 සියවසට පමණ අයත් ලෙන් ලිපි 4 එයට නිදසුන් දක්වයි. 1 වන ලෙන් ලිපියෙන් කියවෙන්නේ **"අශ්වාරෝහක ප්‍රධානියාගේ සොහොයුරු අගිබුති විසින් මෙම පුදබිම සඟ සතු කරවා පූජා කෙරූ බවයි."** පිළිකුත්තුව විහාරස්ථානයෙහි ගල්ලෙන් 99 ක් පමණ තිබෙන අතර එයින් කිහිපයක් කටාරම් රහිත ලෙන් ලෙසට ද කටාරම් කෙටු ලෙන් රාශියක් ලෙසට ද දැකිය හැකිය. ඉන් කටාරම් රහිත ලෙන් තුල ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා වාසය කරන්නට ඇති බව ඉතිහාසඥයෝ ප්‍රකාශ කරති.

**විහාරය**









පිළිකුත්තුව රජ මහා විහාරයේ ප්‍රධානතම ගොඩනැගිල්ල ලෙස ලෙන් විහාරය හඳුනා ගැනේ. මෙහි සැතපෙන පිළිමයක්, හිටි පිළිමයක් සහ සමාධි පිළිමයක් ද, නුවර යුගයට අයත් සිතුවම් රැසක් ද පවතියි. විහාරයේ වූ නා පෙණ හැඩැති ගල් ලෙන යට ඉදි කොට තිබෙන ස්තූපය, නුවර යුගයට අයත් වෙයි. ඊට ඉදිරිපසින් බෝධීන් වහන්සේලා දෙනමක් රෝපිත අතර, ඉන් එකක් **"කුමර බෝධිය"** ලෙසත්, අනෙක **"කුමරි බෝධිය"** ලෙසත් හැඳින්වේ. එම බෝධීන් වහන්සේලා දෙනම ගැන පවතින මතයන් ද ගණනාවකි. කුමර කුමරි යන නාමයන්ගෙන් එම ඇසතු වෘක්ෂයන්ව එදා පටන්ම හඳුන්වා ඇත. දරුපල අපේක්ෂාවෙන් පුද පූජා බාර හාර සිදු කරන්නවුන් අතර පිළිකුත්තුවේ ඇසතු වෘක්ෂයන් දෙනම සුප්‍රසිද්ධ වන්නේ ඓතිහාසිකත්වය හා අනුහසින් සපිරුණු නිසාමය.

පිළිකුත්තුව රජමහා විහාර කන්දෙහි ආවේණික වූ නාමයන්ගෙන් සුසැදි ගල්තලාවන් ද රාශියක් වන අතර එයින් **"බැළුම්ගල"** යන ස්ථානය අතීතයේ ඔත්තු බැලූ ස්ථානයක් ලෙසට පුරාවිද්‍යාඥයන් නම්කරයි. තවද **දිග්ගල, තොප්පිගල, පිලිහුඩුවාගල, ගල පිටගල** ආදිය ප්‍රධාන තැනක් ගනියි. නුවර යුගයට අයත් ලෙන් ආවාසත් ඕලන්ද කාලයට අයත් ලෙන් ආවාසයත් ඉංග්‍රීසි කාලයට අයත් සංඝාවාසයත් යන ආවාස ගෘහයන් 3ක් ද මෙම පුදබිම තුල දක්නට ලැබෙන්නේ ද ඒ ඒ කාලවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මනාව පෙන්නුම් කරමිනි.

**බුද්ධ මන්දිරය**





ඉපැරණි කටාරම් කොටන ලද ගල්ලෙනක් තුල මහනුවර යුගයේදි පිළිකුත්තුවේ **"බුදුමැදුර"**, ලෙන් විහාර සම්ප්‍රදායට අනුව කරවා ඇත. මෙම බුදුමැදුර ඇතුලත හා පිටත වශයෙන් මාල දෙකකින් යුක්ත වන අතර ඇතුලත මාලයේ ප්‍රතිමා හා චිත්‍ර මහනුවර යුගයට අයත්ය. සැතපෙන පිළිමය, හිටි පිළිමය හා සමාධි පිළිමය ද දේව ප්‍රතිමා ලෙසට විෂ්ණු හා නාථ දෙවිවරුන්ව ද අඹා ඇත්තේ මැටියෙනි. බිත්ති මත නුවර චිත්‍ර සම්ප්‍රදාය මානා කොට දක්වමින් රහතන් වහන්සේලාව






අපූර්වත්වයකින් සිත්තම් කර ඇති අතර වහලය සේ තිබෙන කළුගල මත වියනක් සේ දහසක් සියපත් ද සිත්තම් කරවා ඇත. බුදුමැදුරක් තුල භික්ෂූනින් වහන්සේලා නිරූපිත ලංකාවේ ඇති එකම බුදුමැදුර පිළිකුත්තුවේ පිහිටි ලෙන් විහාරයේ ඇති රහත් නොරහත් භික්ෂූනි සිත්තම්ය. අතීතයේ පටන්ම විහාර මන්දිරය තුල කාන්තාවන්ව කිසිම අයුරකින් සිත්තම් නොකිරිනි. එහෙත් පිළිකුත්තුවේදි එම ක්‍රමය වෙනස් වු බවට ලෙන් විහාරය තුල සිත්තම් කර ඇති භික්ෂූනි සිත්තම් සාක්ෂි දරන බව පුරාවිද්‍යාඥයන්ගේ මතයයි.



බුදුමැදුරේ පිටත මාලය තුල ඇති චිත්‍ර සම්ප්‍රදායන් ද පිළිකුත්තුවට ම ආවේණික වු බව විද්වත් මතයයි. ද්වාර පාලක රූප ලෙසට මෙහි සිත්තම් කර ඇත්තේ පෘතුග්‍රීසි සෙබළු දෙදෙනකි. එම සිත්තම් ද දුර්ලභ ගණයේ සිතුවම් ලෙසට දැක්වෙන්නේ බෞද්ධ පුදබිමක එවැනි ආකාරයේ සිතුවම් දක්නට නොමැති හෙයිනි. පිටත මාලයේ බිත්ති මත ජාතක කතා ගනනාවක් සිත්තමට නගා ඇත. එම සිත්තම්ද සුවිශේෂී චිත්‍ර කලාවක් ලෙසට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නම් කරයි. නිරූපිත ජාතක කතා සියල්ලම සිත්තම් කර ඇත්තේ ලන්දේසි ආභාෂයෙනි. ජාතක කතාවල සිටිනා සියල්ලන්ම ඕලන්ද ජාතිකයන් ලෙසට චිත්‍රයට නගා ඇත. තවත් සමහරෙක් එ චිත්‍ර කලාව පහතරට චිත්‍ර සම්ප්‍රදාය යැයිද හදුන්වනු ලබයි. එවැනි චිත්‍ර කලාවක් දක්නට ලැබෙන්නේ මෙම පුදබිම තුල පමණක් වීමද තවත් විශේෂිතය.





පිළිකුත්තුවේ ලෙන් විහාරයේ ඕලන්ද ආභාෂයෙන් සිත්තම් කර ඇති ජාතක කතා තුලින් සමකාලීන ලක්දිව පැවතුණු දේශපාලනික, සාමාජික, ආගමික ස්තරයන් පිලිබඳව මනාව පෙන්නුම් කරන වග චිත්‍ර විශ්ලේෂකයන්ගේ මතයක්ද වෙයි. පිටත මාලයේ වහලය මත ලග්න 12 ද සිත්තමට නගා ඇත. එම සිත්තම්ද සිත් ඇද බැද ගන්නා අයුරින් මනා කොට අලංකාරව සිත්තම් කර ඇත්තේ චිත්‍රවල අගය තවත් තිව්‍ර වන අන්දමයි.


මෙම විහාරස්ථානය දේවානම්පියතිස්ස රජ සමයේ ආරණ්‍යයක් ලෙස පැවැති බවත්, එසේම වළගම්බා රජුට ආරක්ෂාව සැලසූ ස්ථානයක් බවත් පැවසෙයි. අනුරාධපුර යුගයේදී භික්ෂූන් වහන්සේලා මෙහි පැවැති ලෙන් කුටි තුල, භාවනායෝගිව වැඩ සිටි බවටද සාධක පවතියි. මේවන විට කර ඇති කැණීම් තුලින් හමුවු සාධක මතද මෙම පුදබිමේ ඓතිහාසික බව කියාපායි. ඉපැරණි පොශිල, රක්ත වර්ණ වලං කැබලි, පබළු වර්ග, ගල් ආයුධ හා පොළොන්නරු දඹදෙණි යුගවලට අයත් කාසි වර්ගද ඒ අතරින් ප්‍රධාන වෙයි. අද පවතින තත්ත්වයට විහාරය සංවර්ධනය වී ඇත්තේ මහනුවර යුගයේදි හා ඊට පසු කාලයේදීය.

**විහාරයේ ඉපැරණි කෞතුක වස්තූන්**

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් පරිහරණය කළ දෝලාවක් මෙම විහාරයේදී දැකගත හැකිවේ. සුමංගල හිමියන් විසින් වරක් ධර්ම දේශනයක් සඳහා මෙහි දෝලාවෙන් වැඩම කර ඇති අතර සවස් කාලයේදි මහා වැස්සක් නිසා දෝලාවෙන් ගමන යාම අපහසු නිසාත් පිළිකුත්තුව පුදබිමේ තිබුනු තිරික්කලයෙන් වැඩියහ. එම දෝලාව මේ විහාරයේ අදට ද දක්නට ඇත. එය අද වනවිට ප්‍රතිසංස්කරණය කරවා ඇත. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලීයෙන් කරවා ඇති දෙවන දැවමුවා පාලම ද දක්නට ලැබෙන්නේ පිළිකුත්තුව රජමහා විහාරයේදීය. එය මහනුවර යුගයේදි කරවා ඇති බව පුරාවිද්‍යා මතයයි. පිළිකුත්තුව රජ මහා විහාරය සතුව තිබෙන පෞරාණික වටිනාකම නිසා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එය පුරාවිද්‍යා ගල්ලෙන් සංකීර්ණයක් ලෙසට ප්‍රකාශයට පත් කොට තිබෙයි. එසේම දුලබ ගණයේ ගස් වැල් රාශියකින් සපිරි හෙයින් වෘක්ෂ අභය භූමියක් වශයෙන්ද පිළිකුත්තුව විහාර කන්ද නම් කර ඇත.

**වෘක්ෂ අභය භූමිය**






පිළිකුත්තුව රජමහා විහාරයට අයත් වන වණ අරණ, ජෛව විවිධත්වය අතින් අනූන වීම සහ එහි වූ පාරිසරික හා ඓතිහාසික වැදගත්කම නිසා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිසර කළමනාකරණ ව්‍යාපෘතිය අනුග්‍රයෙන්, 2003 නොවැම්බර් 3 වන දිනදී මෙම වනය වෘක්ෂ අභය භූමියක් ලෙස නම් කරන ලදී. ආසියාවේ පැරණිතම පුස් නම් වැල පිහිටන්නේ ද ඓතිහාසික මෙම රජමහා විහාර භූමියේය. විහාරය අවට වූ නේකතුරුලතාවන් අතරින්, වැඩී තිබෙන යෝධ පුස්වැල් මෙහි පැමිණෙන සියළු දෙනාගේම විශේෂ අවධානයකට ලක්වෙයි.







# අෂ්ට ලෝක ධර්මය

**" ලාභො අලාභො අයසෝ යසෝ ච**
**නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං**
**එතේ අනිච්චා මනුජේසු ධම්මා**
**අසස්සතා විප්පරිණාම ධම්මා "**

ලාභය, අලාභය, යසස ය, අයස ය, නින්දාව ය, ප්‍රශංසාව ය, සැපය ය, දුක ය යන මේ ධර්ම අට ලෝක ධර්ම යයි කියනු ලැබේ. මෙලොව වෙසෙන සෑම මිනිසකු කරා ම ඒ ධර්මයෝ වරින් වර පැමිණෙති. චක්‍රයක් සේ කැරකෙන ඒ ධර්මයන් ගේ පැමිණීම අවස්ථාවෙන් අවස්ථාවට සිදුවන නිසා සාමාන්‍ය මිනිසකුට තබා සිටුවරයෙකුට රජ කෙනෙකුට වුවද සෑම කල්හි එක් තත්ත්වයෙන් ම වාසය කරන්නට නොලැබේ.

ලෝක ධර්මයන් අතුරෙන් ලාභය යනු ආහාර පාන වස්ත්‍ර මිල මුදල් ආදිය ලැබීමය. අලාභය යනු ලැබූ දෑ නැති වී යෑම හා ඉදිරියට නොලැබී යෑම ය. කලෙක බොහෝ ලාභ ඇති ව පොහොසත්ව සිටින තැනැත්තා කරා කලදී අලාභය පැමිණෙන්නේ ය. කලක් අලාභයෙන් හෙවත් දිළිඳු කමින් පීඩිත තැනැත්තා කරා කලෙක ලාභය පැමිණෙන්නේ ය. මෙසේ මිනිසාට ලාභ අලාභ දෙක චක්‍රයක් සේ කැරකෙන්නේ ය.

යසස යනු තමා හා එක් ව හැසිරෙන තමාගේ කටයුතුවලට සහභාගී වන පිරිසය. අයසය යනු එබඳු පිරිසක් නැති බව ය. කලෙක මහ පිරිසක් ඇති ව සිටි තැනැත්තා කලෙක මඳ පිරිසක් ඇතියෙන් හෝ තනි වූවෙක් හෝ වේ. තමා අනුව හැසිරෙන කිසිවෙකු නැතිව තනි ව සිටි තැනැත්තා හට කලෙක මහපිරිස් ඇති වේ. මෙසේ දෙ චක්‍රයක් සේ මිනිසා කරා වරින් වර පැමිණේ. කීර්ති අපකීර්ති දෙකට ම යසඅයස යයි කියනු ලැබේ.

කලෙක බොහෝ දෙනාගෙන් ගැරහුම් ලබමින් විසූ තැනැත්තා කලෙක බොහෝ දෙනාගෙන් පැසසුම් ලබන්නේ ය. කලෙක පැසසුම් ලැබූ තැනැත්තා නැවත කලෙක ගැරහුම් ලබන්නේ ය. මෙසේ නින්දා ප්‍රශංසා දෙක වරින් වර මිනිසා කරා පැමිණේ.

කලෙක සැප සේ විසූ තැනැත්තා කරා කලෙක දුක් පැමිණෙන්නේය. කලෙක දුකින් සිටි තැනැත්තා කරා කලෙක සැප පැමිණෙන්නේය. මෙසේ සුව දුක් දෙක වරින් වර මිනිසා කරා පැමිණේ. අටලෝ දහම යනු ලෝකයේ පවතින ස්වාභාවය හෙවත් ධර්මතාවයයි. **''පට්ඨස්සලෝක ධම්මෙහි චිත්තං යස්සනකම්පති''** යනුවෙන් මංගල සූත්‍රයෙහිදී අටලෝ දහමෙහි කම්පානොවන ගතිය මංගල කරුණක් ලෙස දක්වා ඇත.

ලෝක ධර්මයන්ට අනුව පෙළෙන මිනිසා විසින් ඒවා පිළිබඳ මනා දැනුමක් ඇතිව විසිය යුතුය. ලෝක ධර්මයන්ගේ තතු නොදත් නුවණ මඳ පුද්ගලයා ලාභය ය, පිරිවර ය, ප්‍රශංසාව ය, සැපය ය යන අෂ්ට ලෝකධර්මයන් ලබා සිටින අවස්ථාවේ දී ඒවා නිසා උඩඟු වී තමා උසස් කොට ද අන්‍යයන් පහත් කොට ද සිතති. ඒවායින් මත් ව නොයෙක් නො මනා කම් කොට දෙලොවින්ම පිරිහෙති. අලාභය ය, පිරිස් නැති බවය, නින්දාව ය, දුකය ය යන නොමනා ධර්මයන්ට මුහුණ පාන්නට වූ අවස්ථාවේදී බොහෝ තැවෙන්නේය. අන්‍යයන්ට වෛර කරන්නේය. අන්‍යයන්ට ඊර්ෂ්‍යා කරන්නේය. එසේ කොට දෙලොවින් ම පිරිහීමට පැමිණෙන්නේය. ලෝක ධර්මයන්ගේ සැටි තේරුම් ගත් තැනැත්තා විසින් ලාභාදිය ලබා සිටින අවස්ථාවේ දී ඒවායේ ඇති අස්ථිර ස්වභාවය පෙරලෙන ස්වාභාවය සලකා උඩඟු නොවන්නේය. මත් නොවන්නේය. ලාභාදිය ඇතියන්ට ක්‍රෝධ, ඊර්ෂ්‍යා නො කරන්නේය. දුප්පත්කම නිසා නො මනාකම් නො කරන්නේය. තමා පහත් කොට ද නොසිතන්නේය. ලාභාදිය ඇතිවුන් උසස් කොට ද නොසිතන්නේය. මෙසේ ලෝක ධර්මයන් ගැන මැදහත් ව සිතන නුවණැති මිනිසා දෙලෝ වැඩ සිදුකර ගන්නේය. ලෝක ධර්මයන් කෙරෙහි සම ව පැවැත්ම උසස් අදහස් ඇති උත්තම පුද්ගලයන් ගේ ස්වභාවයකි. ලෝක ධර්මයන් නිසා උඩඟු වීම හා ශෝක කිරීම හීනයන්ගේ ස්වභාවයකි.

## ලෝක ධර්මයන් කෙරෙහි සැලකිය යුතු කරුණු

**" ධම්මේන ච අලාභො යො**
**යො ච ලාභෝ අධම්මිකො**
**අලාභො ධම්මිකෝ සෙය්‍යො**
**යං චෙ ලාභෝ අධම්මිකො "**

" ධර්මයෙන් වන්නා වූ අලාභය සහ අධර්මයෙන් වන්නා වූ අලාභය ය යන මේ දෙකින් අධර්මයෙන් වන අලාභයට වඩා ධාර්මික අලාභය ම උතුම් ය " යනු එහි අදහසයි.

**" යසෝ ච අප්පබුද්ධීනං**
**විඤ්ඤූනං අවසො ච යො**
**අයසො ච සෙය්‍යො විඤ්ඤූනං**
**න යසො අප්පබුද්ධිතං "**

" මන්දබුද්ධිකයන් නිසා වන කීර්තිය ය, නුවණැතියන් නිසා වන අපකීර්තිය ය යන දෙකින් මන්දබුද්ධිකයන් නිසා ලබන කීර්තියට වඩා නුවණැතියන් නිසා ලබන අපකීර්තිය ම උතුම් ය " යනු එහි අදහසයි.

**" දුම්මෙධෙහි පසංසා ච**
**විඤ්ඤූහි ගරහා ච යා**
**ගරහා ච සෙය්‍යො විඤ්ඤූං**
**යං චෙ බාලපස්සංසනා "**

" අඥයන් විසින් කරන ප්‍රශංසාව ය, විඥයන් විසින් කරන ගර්හාවය යන දෙකින් බාලයන්ගේ ප්‍රශංසාවට වඩා විඥායන්ගේ ගර්හාව ම උතුම් වන්නේය " යනු එහි අදහසයි.

**" සුඛං ච කාමෙමයිකං**
**දුක්ඛඤ්ච පවිවෙකියං**
**පවිවෙකියං දුක්ඛං සෙය්‍යො**
**යං චෙ කාමමයං සුඛං "**

" කාමසුඛය ය, විවේකයෙන් වන දුක ය යන දෙකින් කාම සුඛයට වඩා විවේකයෙන් වන දුක ම උතුම් ය" යනු එහි තේරුමයි.

# ඒකපණ්ණ ජාතකය

## කිසිදා නොකිපෙනු, ඉවසන්න, මෙත්වඩන්න.

භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහ වනයේ කූටාගාර ශාලා මහා විහාරයෙහි වැඩවසන සේක ක්‍රෑර ලිච්ඡවි කුමරකු ඇරැබෑ මෙය වදාළ සේක.

විසාලා මහනුවර එක් ලිච්ඡවි කුමාරයෙක් චණ්ඩ ය. පරුෂය, බසක් කියතොත් ගහලා බැණලා ම කියයි. හැම විට ම දංඩෙන් පහර ලත් සර්පයෙකු සේ කෝපයෙන් දිලිහි ගන්නේ ය. මා පියොන් සෙසු හැම දෙනාත් ඔහු කෙරෙහි මහත් බියෙන් කල් යවත්, ඔහු හික්මවන්නට කිසි නෑදැයෙකු සමත් නොවීය. දවසෙක මා පියෝ ඔහු කැටුව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් ඔහු ගේ සැටි පවස, 'මොහුට අවවාද කරන සේක්වා' යි භාග්‍යවතුන් වහන්සේ අයැදූහ.

භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ අවවාද කළ සේ. :

"දරුවා, මේ සතුන් කෙරෙහි හැඩි දැඩි රළු පරොස් නො වියැ යුතු.

පරොස් බස නම වැදූ මවට ද පියාට ද පුතුට ද සොහොයුරු සොහොයුරියනට ද බිරියට ද නෑ මිතුරනට ද අප්‍රියත් අමනාපත් වෙයි. හෙතෙම සපන්නට එන සපකු මෙන් ද වෙනෙහි, නැගී සිටි පල් සොරකු මෙන් ද තමන් කන්නට එන යකකු මෙන් ද ඒ නැමිතුරු ආදීනට තැති ගැන්ම ඇති කෙරෙයි. මරණින් පසු නිරයෙහි ඉපිද දුක් විඳින්නේ ය. ක්‍රෝධ කරන සුලු තැනැත්තේ හැඳ පැලැඳ මැනවින් සැරැසුණේ ද මේ ලෝහිදී ම දුර්වණී වෙයි. ඔහුගේ මුහුණ පුන් සඳ මඬලක් සේ සිරිමත් වුව ද ගිනි දුම වැද ගත් පියුමක් සේ නිශ්ශෝභ වෙයි. නපුරු පෙනුම් ඇත්තේ වෙයි. සත්ත්වයෝ ක්‍රෝධය නිසා තුමු, තමනට ම පහර දී ගතින්, විස කත්, බෙල්ලැ වැල ලා ගෙන හෝ මියෙත්. මහ පල්ලම්වලට පැන නො නසිත්, මෙ සේ මැරී නිරයේ ඉපිද බොහෝ දුක් විඳිත්, නැවත මිනිස් වැ උපන්නත් උපන් ද පටන් නිතර ලෙඩින් පෙළෙන්නෝ වෙති. ඇස් ලෙඩ කන් ලෙඩ ආදි ලෙඩවලින් එකක් සුව වන විට තවෙකෙක් වැලඳෙයි. ලෙඩින් නො මිදුණෝ වැ නිතර ම දුකින් පසුවෙත්. එබැවින් හැමදෙනා කෙරෙහි මෙත් සිතින් ඉත සිතින් මොළොක් සිතින් විසිය යුතුය. මෙසේ මෙත් සිතින් කල් යවන්නෝ නිරය භයාදියෙයන් මිදෙත්."


මේ අවවාද ඇසු තැන් පටන් හෙතෙම ඉවසන සවභාවය ඇති වැ මෙත් සිතැති වැ ශාන්ත වැ දාන්ත වැ කල් යැවීය. භාග්‍යවතුන් වහන්සේ ඒ කුමරු හික්මැවූ සැටිය ගැන භික්ෂූහු දම් සබායෙහි කතා කරමින් හුන්හ. එ විට භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ, එ පවත් අසා, පෙරත් මම මොහු හික්මැවිමි යි වදරා මේ ජාතකය දෙසූ සේක. :

"එක් කලෙක බමුණු කුලයෙක ගුණ නුවණැති දරුවෙක් විය. එතෙම දෙමාපියන් කළුරිය කලාට පස්සේ ගිහි සැප හැර දමා තපස් රකින්නට හිමාලය වනයට ගියේ ය. කලින් කල ඒ තාපසයා ලුණු ඇඹුල් සොයාගෙන බරණැස් නුවරට ආයේය. දවසෙක නගරයේ පිණ්ඩපාතයේ යන මෙ තවුසා දුටු බරණැස් රජ පැහැද 'තාපසයා එක්ක එන්නැ'යි කියා අමාත්‍යයන් යැවී ය. අමාත්‍යයෝත් ගොස් රජුගේ පණිවුඩය කීහ. එවට තවුසා, "මා රජ්ජුරුවන් හඳුනන්නේ නෑ. රජ්ජුරුවන් සමග මාගේ යාළු කමකුත් නෑ. මම හිමාලය වනයේ ඉඳලා ආ තාපසයෙක්" කියා රජ මාලිගාවට යන්නට කැමති නොවී ය. ඇමැතියෝ මේ බව රජුට කීහ. ඒ ඇසු රජතුමා "ඔබ වහන්සේ හැර තාපසයකු අප දැකලා නැත. වෙන යහළු තවුසෙකුත් අපට නැත. එ හෙයින් මෙහි වැඩම කරන්නැය" දෙවන වරටත් කියා යැවී ය. තාපසයාත් රජ මාලිගාවට වැඩියේ ය. රජ තෙම තාපසයා වැඳ සත්කාර කැරැ 'ඔබ වහන්සේ කොහේ වඩිනවාදැ' යි ඇසී ය. 'හිමාලය වනයේ ඉඳලා වැසිකාලය පැමිණ හෙයින් වස් වසන්නට හොඳ තැනක් සොයා ගෙන යනවා යැ'යි තාපසයා කී ය. රජතෙම තමා ගේ උයනේ වස් වසන්නැ යි තවුසා අයැදී ය. තාපසයාත් කැමැති විය. ඉන්පසු රජ තවුසා සමඟ උයනට ගොහින් වස් වස්වා, අත් පා මෙහෙවර කරන්නට උයන බලාගන්න මිනිහාට බාර කලේය ඒ රජ්ජුරුවන්ට නපුරු පුතෙක් විය දෙමාපියන් කියන දෑ වත් හේ නොඅහන්නේ ය. මේ නිසා කවුරුත් ඒ කුමාරයාට දුෂ්ට කුමාරයා යැ යි නම් කළහ. රජ මේ කුමාරයා හොඳට හද ගන්නට ඕනෑ කෙළේය. එක් දවසක් රජ මේ දුෂ්ට කුමාරයාත් එක්ක තාපසයා බලන්නට ගොහින් තාපසයාට තමාගේ පුතාගේ ඇති නරක ගති ටික කියා ඔහු හොඳ කෙනෙකු කැර දෙන්නැ යි කුමරු තාපසයාට බාර දී මාලිගාවට ගියේ ය. තාපසයාත් දුෂ්ට කුමාරයා අතින් අල්ලා ගෙන උයනේ එහාට මෙහාට ඇවිද්දේ ය. එසේ ඇවිදින ගමන් එක තැනකදී යම් තම් පෙති දක එළියට ඇදුණු කොහොඹ පැලයක් කුමාරයාට පෙන්වා එයින් එක පෙත්තක් විකා බලන්නැ යි කීය. නපුරු කුමාරයාත් ඒ පුංචි කොහොඹ පැලෑටියේ එක පෙත්තක් සපා තිත්ත නිසා ඒ පැලය උදුරු පාගා පොඩි කැර දැමී ය. තාපසයා එවිට ඒ කුමරයා ගෙන්

කොහොඹ පැලය එසේ පොඩි කැර දමන්න හේතුව ඇසී ය. එවිට දුෂ්ට කුමාරයා "තාපසයන් වහන්ස, මෙච්චර පුංචි කාලයේ මේ කොහොඹ පැලය මෙ තරම් තිත්ත නම් වැඩී ලොකු ගසක් වුණා ම කොච්චර තිත්ත වේද? ඒ නිසා එය දැන් ම ගලවා දැමීමි"යි කී ය. ඒ ඇසූ තාපසයා "බලන්න, කොහොඹ පැලය තිත්ත වූ නිසා එය වැඩෙන්නට නොදී ඔබ ගලවා දැමූවා. ඒ වගේ ම ඔබ කුඩා කාලයේ ම නපුරු යැ යි චණ්ඩයැ යි අමාත්‍යයනුත් රට වැසියාත් පිළිගත්තොත් 'මොහු රජ වුණා ම කොතරම් නපුරු වේවි ද?" කියා, පුංචි කාලේදී ම පාගා විනාශ කැර දමන්නට පුළුවන. ඒ නිසා දැන් සිටම නපුරු කම් චණ්ඩකම් අත හැර දමන්නැ'යි අවවාද කෙළේය. කුමාරයාට ද කාරණය සිතැ කා වැදිණ. එතැන් සිට ඒ කුමාරයා ගුණවත් විය.

"එදා දුෂ්ට කුමාරයා මෙදා ලිච්ඡවී කුමරු ය. ඔහුට ඔවා දුන් තවුසා තමන් වහන්සේම" යි වදාළ සේක.

(අනුන් ගෙන් උදවු උපකාර ලබන්නට හිත ඇත් නම, ගරු බුහුමන් ලබන්නට කැමැති නම්, ප්‍රධානයකු වන්නට ආශා නම්, හොඳ ගති පුරුදු කැර ගෙන නරක ගති හැර දමන්නට ඕනෑ බව මතක තබා ගත යුතුය. )



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# අසරණ සරණ ශිෂ්‍යත්ව අරමුදල

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නට කැමති පිංවතුන් විසින් පිරවීම පිණිසයි.**

ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුඃ කඃ 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජික අංකය :.............................................

දානපති / පතිනියගේ නම :.............................................


ලිපිනය :.............................................

දුරකථන අංක :.............................................

මා විසින් මසකට රුපියල් 500.00 / 1,000.00 / 1,500.00 හෝ කැමති ගණනක් රු............................................. බැගින් වන ශිෂ්‍යත්ව ............................... ක්, මාස ............................... / අවුරුදු ............................... තුළ දී හෝ දරුවන් උසස් අධ්‍යාපනය නිමා කරන තෙක් ලබා දීමට කැමති බැව් දන්වන අතර එම ශිෂ්‍යත්ව පිරිමි / ගැහැණු දරුවන් ........................... දෙනෙකුට ලබාදීමට කටයුතු යොදන ලෙස ඉල්ලමි. නැතහොත් මාස 3 කට/ 6 කට / 12 කට වරක් එකවර එම මුදල කාර්යාලයට ලබා දෙන බවට පොරොන්දු වෙමි.

දිනය :............................................. අත්සන :.............................................

**ශිෂ්‍යත්ව පිරිනැමීම,**
**පාසලේ වසර 1-5 තෙක් නම් මසකට රු.500.00 / වසර 6-9 තෙක් නම් මසකට රු.1000.00 / සාමාන්‍ය පෙළ - උසස් පෙළ - විශ්වවිද්‍යාල සඳහා රු.1500.00 ලෙස දායකත්වය ලබාදිය හැක**



# 2021/2022 මෙත් සවිය කමිටුවල පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීම

**මෙත් සවිය මෛත්‍රී සංසදයේ වාර්ෂික මහ සමුළුව, දහ අට වන වර්ෂ පූර්ණ සැමරුම**
**2021 මැයි මස 2 වන දින, ප.ව. 3.00 - 5.00 දක්වා**
**කොළඹ 08, බොරැල්ල, ලෙස්ලි රණගල මාවතේ පිහිටි ශ්‍රී ලංකාරාම විහාරස්ථාන ශාලාවේ දී.**

මෙත් සවිය මව් කමිටුවේ පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීමට කැමති සාමාජිකයින් පහත කොටස පුරවා නොපමාව (සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා) හෝ කාර්යාලයට තැපෑලෙන් හෝ ඊමේල් / ෆැක්ස් මඟින් හැකි ඉක්මනින් ලැබෙන්නට සලස්වන්න. මේ දින වල දිනපතා ම පාහේ බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී ඉරුදින දහවල් භාවනා වැඩසටහනට පෙර හෝ පසුව හෝ දුරකථන ඇමතුමක් දී, පහසු වේලාවක පැමිණ හෝ හමුවිය හැකිනම් වඩා හොඳය. සුදුස්සන් තේරී පත්වනු ඇත.

මෙයට මෙත් සිතැති,

**මහාචාර්ය චන්දන ජයරත්න මහතා** (සභාපති)

දුරකථනය : 0714 800 800 Email : chandanajayaratne@gmail.com

---

# 2020 / 2021 මෙත් සවිය මව් කමිටුවේ සහ අනු කමිටුවල සහ කළුතර ශාඛාවේ

**මව් / තරුණ / කාන්තා / වෙබ් හා මාධ්‍ය / දාන-සීල-භාවනා / සුවසෙත / අසරණ සරණ / නීති / සුභසාධක / පර්යේෂණ කමිටු වල සහ කළුතර ශාඛාවේ**

## නිලතල ඉල්ලීම සඳහා අයදුම් පත්‍රය

**2019 - 2020** වසර දෙකෙහි එකම නිලතල වල හෙබි සාමාජිකයින් නැවත එම තනතුරු සඳහා අයදුම් නොකරන්න. එහෙත් වෙනත් නිලතලයන් ඉල්ලුම් කල හැක.

**නිළතල සඳහා ඉල්ලුම් කරන අය දහමට ලැදි, සමාජ සේවයට කැමති, මෙත් සවිය ගුණ වැඩීමේ ක්‍රමවේදය පුරුදු පුහුණුකරන තැන්පත් අය විය යුතුය. මල් පුදා ගුණ පහ නොවඩන අය අයදුම් කිරීමෙන් වලකින්න.**

**ඉල්ලුම්කරනු ලබන කමිටුවේ නම** :............................................ සාමාජික අංකය :....................

නම :............................................................

ලිපිනය :............................................................

දුරකථන අංකය :.................................... විද්‍යුත් තැපෑල :....................................

............................................................

ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :............................................................

අයදුම්කරුගේ රැකියාව :.................................... තනතුර :....................

රැකියා ස්ථානයේ ලිපිනය :............................................................

අයදුම්කරුගේ පියා හෝ මව කල රැකියාව :............................................................

**තෝරාගැනීම පහසු වීම සඳහා වෙනත් අදාල විය හැකි කරුණු,**

ඔබ මෙත් සවිය මඟින් කර ඇති පරිත්‍යාග හා අනු කමිටුවල දරන ලද තනතුරු / පුහුණු වැඩසටහන් සඳහා (Please attach a separate sheet or CV):............................................................

එක් තනතුරකට වඩා ඉල්ලීම කල හැකිය. සෑම කමිටුවක් සඳහාම අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කල හැක. එක් අයෙකුට කමිටු 2 කට වඩා තනතුරු දැරිය නොහැක. සුදුස්සන් තෝරාපත්කරන්නෙමු. කරුණාකර පහත කොටසේ කොටු තුල තමා වැඩිම කැමති තනතුර ඉදිරියෙන් 1 ලකුණ දමන්න. දෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 2 ලකුණ දමන්න. තෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 3 ලකුණ දමන්න. වත්මන් අනු කමිටු වල තනතුර ලාභීන්ට ද මෙම මව් කමිටු තනතුරු සඳහා ඉල්ලීම කල හැක. එහෙත් මව් කමිටුවට පත්වුවහොත් අනුකමිටු තනතුර අතහැරිය යුතුවේ.

| | | |
|---|---|---|
| **1. ගරු සභාපති** ☐ | **2. ගරු උප සභාපති** ☐ | **3. ගරු සම ලේකම්** ☐ |
| **4. ගරු භාණ්ඩාගාරික** ☐ | **5. ගරු උප භාණ්ඩාගාරික** ☐ | **6. ගරු සංස්කාරක** ☐ |
| **7. ගරු කාරක සභික** ☐ | | |

ඉහත නිලතල බලාපොරොත්තු නොවන එහෙත් කමිටු සාමාජිකත්වය පමණක් බලාපොරොත්තු වන අය තමා කැමති කමිටුවේ / කමිටුවල නම / නම් (උපරිම කමිටු 2ක් පමණි) මෙහි ලියන්න. :............................................................

අයදුම්කරුගේ අත්සන :.................................... දිනය : ............/............/............

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම්වරු වන මංජුල පත්මකුමාර මහතා (071 529 5855) / පියල් චන්ද්‍රතුංග මහතා (071 450 1358) අමතා ද හදිසි තොරතුරු සඳහා වෙබ් කමිටු සභාපති චින්තක බණ්ඩාර මහතා (0718 114 477) අමතා තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00 - 1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 45 වන භාවනා වැඩසටහන

45 වන භාවනා වැඩසටහන 2021 ජූලි මස 11 වන ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2021/06/25 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. ඉන්පසු ලැබෙන අයදුම්පත් ද ඉඩකඩ තිබුනහොත් සලකා බලනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 40 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 40 වන වැඩමුළුව 2021 - 06 - 06 වන ඉරු දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 40 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2021 - 05 - 16 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.

**T.S.H.TECHNOLOGIES**

**පරිගනක, රූපවාහිනී අලුත්වැඩියාව / ශබ්දවාහිනී උපකරණ නිපදවීම සහ නව නිර්මාණ කරණය**

**071 66 00 317**

(සාමාජික - 43 කණ්ඩායම)

**ගණකාධිකරන හා මුල්‍ය සේවා**

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර, සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය, ගිණුම් පිලියෙලකිරීම්, ආදායම් බදු හා මුල්‍ය කළමනාකරණ උපදෙස් හා සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.

**විස්තර : 077 2355117 අමතන්න.**

**දිදුලක ක්‍රියේෂන්ස්**

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස **මුතුකුඩ නිර්මාණය**

මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා **සාරි නිර්මාණය කරනු ලැබේ**

**සාමාජිකා - දිලිනි**

බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත් සාමාජිකාවකට (සා.අංක. 34-5228) නැගී සිටීමට අතහිත දෙන්න...

**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**

පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය භාර දීමට විමසන්න - **0772 353 392**

**ජල රකුසාගෙන් ගැලවෙමු ග්‍රන්ථය**

කර්තෘ : පියදාස සිල්වා (සා:අ: 15-2738)




- භාවනාව • ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුද්‍රණ වියදම රු. 350**
**අලෙවි මිල රු. 250**
දු:කඃ 075 712 8960

**පසුගිය වසරේ ලාභය බුදු පිළිමය තැනීම සඳහා පිරිනමන ලදී**

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

**SIGHT 'N' STYLE OPTOMETRISTS**



නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**මැහුම් කලාව පුහුණු කිරීම**



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම.** නිවස අලංකාරයට බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදි බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බිලවුස් සහ සාරිය දක්වාත්, නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි ඉතා සියුම් නිර්මාණ පුහුණු කරණු ලැබේ.

**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**

(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)

# මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ........................................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................

07. ස්ථිර ලිපිනය ........................................

විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:ක: නිවස .................... ජංගම ....................

08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .................... / පිරිමි දරුවන්ගේ වයස් ....................

11. රැකියාව හා තනතුර ........................................

ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ........................................

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ........................................

13. ලිපි එවිය යුතු ලිපිනය ........................................

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ........................................
2. ........................................

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ........................................
2. ........................................
3. ........................................

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................................

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

........................................

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ........................................

........................................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ....................

.................... ....................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ....................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අඟහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ගරු ලේකම්, මෙත්සවිය, අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුරකථන : 0112 505088, 0714 014467

**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**



# 2021 වසරේ ප්‍රථම හීල් දානමය පුණ්‍යකර්මය


# හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය

සෑම වර්ෂයකම සිදුකරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් 2021 ජනවාරි 01 වන දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී ස්වාමීන්වහන්සේලා 37 නමක් උදෙසා සිදු කරන ලදී.



















# අභය දානය

මෙත් සවිය අසරණ සරණ කමිටුව විසින් මරණයට කැප වූ අසරණ එළ හරකුන් සහ පැටවුන් කිහිප දෙනෙකුට අභයදානය ලබා දීමෙන් අනතුරුව ඔවුන් රැකබලා ගැනීමට හොරොව්පතාන ප්‍රදේශයේ සුහද ගම්මානයේ පවුල් කිහිපයකට පරිත්‍යාග කිරීම / ප්‍රදේශ වාසීන්ට ජලය ලබාගැනීම සඳහා වතුර පොම්පයක් පරිත්‍යාග කිරීම / ආහාර පාන හා පරිත්‍යාග සිදු කිරීම. (2019/09/19)











2/99, කඩව පාර, 011 2827044 / 0712 285 680